# ආපදා (දුක) ඇතිවීමට හේතු: බෞද්ධ විමසුම (පංච නියාම ධර්ම)

කුඩාකත්තෝර්රුවේ විනීත හිමි

## හැඳින්වීම

මිනිසා කායික හෝ මානසික දුක්, විපත් ජන්මයෙන් උරුම කරගෙන සිටී. එහෙත් එයින් මිදීම හෝ නිවාරණය කිරීම පිණිස ආපදාවන් ඇතිවීමේ හේතු කවරේද යන්න හඳුනාගත යුතුය. ලෝකය වඩාත් සංකීර්ණ ලෙස වෙනස් වෙමින් පවතී. එනිසා කාල දේශානුරූපීව ආපදාවන්ගේ ස්වභාවය හා ඒවාට බලපාන හේතු විවිධ වේ. හේතුඵලවාදි න්‍යාය මත බුදුදහම කාල දේශ භේදයකින් තොරව යමක් සිදුවීම සඳහා බලපාන නියාම ධර්ම හඳුනාගනී. ඒ අනුව ආපදා ඇතිවීම සඳහා බලපාන හේතු කවරේද යන්න විමසා බැලිය හැකිය.

බුදුදහම පුද්ගලයා හා ලෝකය පිළිබඳ වූ යම්දෙයක් සිදුවීම සඳහා විවිධ හේතු ප්‍රත්‍යය වියහැකි බව අවධාරණය කරන බැවින් අටුවාචාරීන් වහන්සේලා එවැනි කොටස් පහක් පංච නියාම ධර්ම යටතේ පෙන්වා දෙති. 'නියාමය' යනු මෙහෙය වන්නෙකු නොමැතිව ස්වභාව ධර්මයෙන් ඇතිවන නියමය හෙවත් ස්වාභාවික නියමය යි.[1] එවැනි නියාම ධර්ම ලෙස 'මෙහෙය වන්නෙකු නොමැතිව පුද්ගලයාට බලපාන කම්ම, උතු, බීජ, චිත්ත හා ධම්ම යනුවෙන් ධර්ම පහකි.[2] ඒවා පුද්ගලයාගේ සහ ලෝකයේ පැවැත්ම තීරණය කරන කාරණා ලෙසත් එයට අනුව ම ලෝකය පවතින බවත් පිළිගනී.[3] මෙම ධර්ම පහට අදාළ කාරණා මුල් බුදුසමයෙහි විවිධාකාරයෙන් දැක්වේ. එහෙත් අටුවාචාරීන් වහන්සේලා තත් කාරණාවන් අටුවාවන්හි විවිධ තැන්වල විස්තර කරති. එනිසා ම ඒවා පෙර දැක්වූ හේතුඵල න්‍යාය මත ලෝකය හා පුද්ගලයා කේන්ද්‍ර කරගත් සියලු සඞ්ඛත ධර්මයන්ට බලපාන අයුරු හඳුනාගත හැකිය. ලෞකික ව්‍යවහාර වශයෙන් සුඛ-දුක්ඛ සියල්ලට හේතුප්‍රත්‍යය වන්නේ එය යි.

දීඝ නිකාය (2) මහපදාන සූත්‍ර දේශනාවේ එන 'ධම්මතා'[4] යන්න සුමඞ්ගලවිලාසිනී අටුවාවේ විස්තර කෙරෙන්නේ පංච නියාම ධර්ම මඟිනි.[5] ඒ අනුව නියාම ධර්ම පෙර කී පරිදි පස් ආකාර වෙයි. ධම්මසඞ්ගණිප්පකරණ අට්ඨකථාවේ ද නියාම ධර්ම පහ ගැන

කියැවේ.[6] ලෝකය හා සත්ත්වයා පිළිබඳ බලපාන ආපද විෂයෙහි මූලික කාරණා වශයෙන් පංච නියාම ධර්ම හඳුනාගත හැකිය. මිලින්ද ප්‍රශ්නයේ දී කර්මක්‍ෂය ප්‍රශ්නය තුළ මිළිඳු-නාගසේන හිමි සංවාදයේ දී විවිධ නියාමයන් විවිධාකාරයෙන් පුද්ගලයාට විපත් ගෙනදෙන දෙන්නට ඉවහල්වන බව දීර්ඝව පැහැදිලි කර ඇත. එයින් වඩාත් තහවුරු කරන්නේ සියල්ල හුදු කර්මය මත තීරණය කරන්නට බොහෝ දෙනා පෙළඹෙන නමුත් එය එසේ ම නොවන බව යි. විවිධ නියාමයන්ගේ බලපෑම ඇති බව යි. "මහණෙනි, කිපෙන්නා වූ පිත සීතයෙන් ද උෂ්ණයෙන් ද විෂම භෝජනයෙන් දූයි ත්‍රිවිධාකාරයෙන් කිපෙන්නේ ය. මහණෙනි, කිපෙන්නා වූ සෙම සීතයෙන් ද උෂ්ණයෙන් ද භෝජනාදියෙන් දූයි ත්‍රිවිධාකාරයෙන් කිපෙන්නේ ය. මහණෙනි, යම් වාතයක්, පිතක්, සෙමක් ඇත්ද ඒ කිපීම්වලින් මිශ්‍රව තම තමන්ගේ ස්වකීය වේදනාවට අදින්නේ ය. ඍතු පරිණාමයෙන් වූ වේදනාව ඍතු පරිණාමයෙන් වන්නේ ය. ....මෙලෙස කර්ම විපාකවූ ආබාධ ඉතා මද ය. අවශේෂ වූ ආබාධ ඉතා බොහෝය.'[7]

මේ අනුව ආපදාවන් ඇතිවීම සඳහා බලපාන හේතු කාරණා මූලික තේමාවන් කිහිපයක් යටතේ හඳුනාගත හැකි ය. එනම්,

මානසික හේතු
චර්යාත්මක හේතු
සමාජීය හේතු
ස්වභාවික හේතු වශයෙනි.

## මානසික හේතු

ආගමික-දාර්ශනික ප්‍රස්තුතයක් වශයෙන් මෙන් ම සාමාන්‍ය ව්‍යවහාරයට අනුව ද පුද්ගලයා ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ. එනම් කායික හා මානසික යන උභයාංශය යි. එහි පැවැත්ම හෝ ස්වභාවය පිළිබඳ ව ඇත්තේ විවිධ මතවාදයන් ය. ඒ අතර ලෝක ආගම් ඉතිහාසයේ මනසට ප්‍රමුඛත්වය දුන් ප්‍රධානතම ආගම බුදුදහම යි. සැප (සුඛ) හෝ දුක් (දුක්ඛ) වශයෙන් පුද්ගලයා විසින් වින්දනය කරන



සකලවිධ කාරණාවන්හි මූල හේතුව මනස යි.[8] එනිසා ම චේතනාව ම කර්මය බව පවසයි.[9]

ලෝකය මෙහෙයවන ප්‍රධාන බලවේගයක් ලෙස දක්වා ඇත්තේ ද චිත්තය හෙවත් මනස යි.[10] චිත්ත සූත්‍රයේ දී තවදුරටත් පෙන්වා දෙන්නේ, සියල්ලෝ ම සිත් නමැති එක ම දහම්හුගේ වසයට පත්ව ඇති බව යි.[11] එමෙන් ම ඒ සඳහා පසුබිම් වන මානසික ස්වභාවය තණ්හාව යි.[12] බුදුන් වහන්සේ රට්ඨපාල තෙරුන් වහන්සේට දේශනා කළේ, සෑම පුද්ගලයෙකු ම විවිධ ප්‍රමාණයන්ගෙන් තණ්හාවට දාසව සිටින බව යි.[13] මේ අනුව ලෝකය හා සත්ත්වයා, මනස සහ තණ්හාව විසින් පවත්වනවා යනු ඉන්ද්‍රිය ගෝචර දෑ කෙරෙහි ඇලීම නිසා සීමාන්තික ලෙස අරමුණු සඵල කරන්නට කරන උත්සාහය නිසා සියල්ල සිදුවීම යි.

පූර්වෝක්ත පංච නියාම ධර්මවලින් එකක් වන්නේ චිත්ත නියාමය යි. එනම් සිත පිළිබඳ නියමය යි.[14] රූපාදී ආරම්මණ චක්ෂුරාදී ප්‍රසාදයන්හි ගැටුණු විට කිසිදු බලපෑමක් නොමැතිව ඉබේ ඇතිවන සිත් පරම්පරාව පිළිබඳ නියමය යි.[15] සුමඞ්ගලවිලාසිනී අටුවාවේ විස්තර කෙරෙන්නේ,[16]

කලින් කලට ඇතිවන චිත්ත චෛතසික ධර්මයන්
පසුව ඇතිවන චිත්ත චෛතසිකයන්ට ආධාර වන
හෙයින් ප්‍රත්‍යය නම් වේද මෙසේ චක්‍ෂු විඥාන
ආදීන්ට අනතුරුව පිළිගැනීම් ආදියේ හටගැනීමත්
යන මෙය චිත්ත නියාමය යි. යනුවෙනි.

මෙයින් බුදුදහම ලෝකය හා සත්ත්වයා පිළිබඳ ව කරන විග්‍රහයේ දී මනස පිළිබඳ ව පුළුල්ව සාකච්ඡා කොට ඇතත් එපමණකින් එය විඥානවාදයක් නොවන්නේ ය. පුද්ගලයා ගොඩනගාගත් සිත විසින් තෙමේ ම පාලනය කෙරෙයි. එහෙයින් හේතුඵලවාදීව ආපදා ඇතිවීම විෂයෙහි මානසික කාරණාවන් ද හේතු වන බව පෙනේ.

බුදුදහම පෙන්වා දෙන්නේ මූලික වශයෙන් මිනිස් සිතෙහි බලපවත්වන ඍණාත්මක තත්ත්ව හෙවත් අකුසල් සිත් තුනක් ඇති බවයි.[17] ලෝභ, ද්වේෂ හා මෝහ යන එම අකුසල මූලයන් වේ. අකුසල සහගත මානසිකත්වයෙන් කරන ක්‍රියාවන්හි බලපෑම ම මූලික වශයෙන් මානව ආපදවන් සඳහා හේතු වේ. පට්ඨාන මහා ප්‍රකරණ සන්නයෙහි දක්වෙන ආකාරයට ලෝභ, ද්වේෂ හා මෝහ යන අකුසල

මූලයන් (අකුසල සහගත) අරමුණු හා බැඳී පවතින බව සවිස්තරව දක්වයි. ඒවා පොළොව මත නොසැලී රැඳෙන්නට ගසකට මුල් ආධාර වන්නාසේ දැඩිව බැඳී පවත්නා නිසා හේතු නමින් හැඳින්වෙන බව ද වැඩිදුරටත් පෙන්වා දෙයි.[18] මෙලෙස දැක්වෙන අකුසල මූලයන් ආපද සහගත සියලු ක්‍රියාවන්ට මුල් වෙයි.

ඇස් කන් නාස් ආදියෙන් වැද ගන්නා රූපාදී අරමුණු වෙත ඇතිකරගන්නා තෘෂ්ණාව මුල්කරගත් ආශාව, මසුරුකම, ගිජුබව, ලොල් බව ආදී ලෝභාකෘෂ්ට මානසිකත්වය ලෝභය නම් වේ.[19] ලෝභෝත්සද බවින් යුතු තැනැත්තා විසින් කායික, වාචසික හෝ මානසික වශයෙන් කරණ ක්‍රියා ආත්මාර්ථය පෙරටු කරගනී. අටුවාව පැහැදිලි කරන්නේ රූපශබ්දාදි අරමුණු කෙරෙන් කැමැත්තෙන් ඇලීමේ ශක්තිය ලෝභය බව යි.[20] එම මානසිකත්වයෙන් යුතු පුද්ගලයා නිරන්තරයෙන් ආත්ම තෘප්තිය පමණක් අරමුණු කරයි. කහවණු වැස්සකින් වුවත් එම මානසිකත්වය දුරුකිරීම අපහසු යැයි[21] කෙරෙන දේශනාවෙන් එය කෙතරම් බලවත් මානසික තත්ත්වයක් ද යන්න පැහැදිලිවේ. ආත්මාර්ථය වැඩෙන බැවින් පරාර්ථය ගැන නොසිතයි. එය පුද්ගලගත මෙන් ම සමාජගත වශයෙන් හටගන්නා ආපදාවන්ට පසුබිමවේ.

> 'මහණෙනි, යම් ලෝභයෙක් වේ ද, හෙ ද අකුසල ය.
> ලුබ්ධ වූයේ කයින් වේවයි වචසින් වේවයි මනසින්
> වේවයි යමක් පිළියෙළ කරන්නේ නම් එ ද අකුසලය.
> .....මෙසේ ලෝභයෙන් හටගත් ලෝබය නිදාන කොට
> ඇති ලෝභය සමුදය කොට ඇති ලෝභය ප්‍රත්‍යය
> කොට ඇති අනේක පාපක අකුසල ධර්මයෝ ඕහට
> පහළ වෙත්.'[22]

මෙම ලෝභය පදනම්ව ම බාහිර ලෝකය කෙරෙන් පුද්ගල ප්‍රේරණය ඇතිවේ. ඉන්ද්‍රිය ගෝචර වස්තූන්හි ස්වභාවය හෝ සීමාව ආවරණය වන්නේ ලෝභයෙනි. පෘථජ්ජන මනසෙහි විවිධ ප්‍රමාණයන්ගෙන් එය පවතී.

මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රය පුද්ගල සන්තානගත කාමය නිසා ක්‍රමයෙන් සමාජ අරගල නිර්මාණය වන ආකාරය විස්තර කරයි.

> '....කාමයන් හේතු කොට ගෙන, කාමයන්
> මූලකාරණය කොට ගෙන, කාමයන් කරුණු
> කොට ගෙන, කාමයන්ගේ ම හේතුවෙන්
> රජහු ද රජුන් සමග විවාද කරත්. ක්ෂත්‍රියයෝ



> ද ක්ෂත්‍රියයන් සමග... විවාද කරත්.
> .....රණබිමට වදිත්.... මේ දුක් රැස ම කාමය
> මූල කාරණය කොට කාමය හේතු කොට
> ඇත. කාමය කරුණු කොට ඇත. කාමයන්ගේ
> ම හේතුවෙන් වෙයි.[23]

මෙයින් පුද්ගලයා මූලිකව අධ්‍යාත්මිකව පිරිහීමත් එනිසා ම සමාජමය වශයෙන් මහා විනාශයන් කරා ක්‍රමයෙන් පෙළඹෙන අයුරු පැහැදිලි කර තිබේ. එමෙන් ම සුත්ත නිපාතයේ දී කාමය මුල් කරගත් මෙම සමාජ අරගලය සිඳීගිය දියත්තක දඟලන මාළුවන් මෙනැයි පෙන්වා දී තිබේ.[24] එපමණකට කාමයෙන් මඬනා කල්හි ඔවුනොවුන් ගැටෙන්නේ ය. සුත්ත නිපාතයෙහි ම කාම සූත්‍රයෙහි දී පෙන්වා දෙන්නේ දේපළ, සතුන්, මාගමුන් ආදී කාම වස්තූන් පුන පුනා ප්‍රාර්ථනා කිරිම නිසා පුද්ගලයා ප්‍රකට සහ අප්‍රකට උපද්‍රවයන්ට පත්වන බව යි.[25]

ද්වේෂය නම් සිතින් ඇති කර ගන්නා අරමුණෙහි ඇතිවන විරුද්ධ ස්වභාවය, අරමුණට නොකැමැති ස්වභාවය, අරමුණු නොඉවසන ගතිය, වෛරය, කෝපය, දෝසය යි.[26] තමාගේ සිත් නොගත් තමා නොකැමැති අරමුණු නිසා සිතෙහි උපදනා සැඩ බව යි. එම දුර්වල මානසිකත්වය විසින් පුද්ගලයා සහ ඔහුගේ අරමුණු සියල්ල දූෂණයට පත්වේ.[27] එවිට යොමු වන්නේ තමන්ටත් අනුන්ටත් යන දෙපිරිසට ම අනර්ථකර වූ චර්යාධර්මයන් විෂයෙහි ය.

> 'ද්වේෂයෙන් දූෂිත වූයේ ද්වේෂයෙන් මැඩුනේ තමාට
> අවැඩ පිණිස පරහට අවැඩ පිණිස සිතන්නේ ය. ඒ
> හේතුවෙන් දිවා රෑ දෙක්හි සිත තළමින් පෙළමින්
> උපදනා දුක් දොම්නස් විඳින්නේ ය. ....ආත්මාර්ථය හා
> පරාර්ථය හා ආත්මාත්ථපරාත්ථ තතු ලෙසින්
> නොදන්නේ ය. ....'[28]

ද්වේෂය සාමාන්‍ය සිත්වල උපදින පොදු මානසිකත්වයකි. එහෙත් ඒ ඒ පුද්ගලයා තුළ පවත්නා ද්වේෂ සහගත බව ද විවිධය. කවර තරමින් වුවත් එය යහපත් ඵල නොගෙනෙන බව 'ද්වේෂය මහාසාවiයැ'යි[29] බුදුන් වහන්සේ දේශනා කිරීමෙන් ම පැහැදිලිවේ. තව ද වසල සූත්‍රයේ[30] දී දැඩිකෝපයෙන් මඬනා ලද තැනැත්තා පව්ටු විපත්තිකර චිත්තාවේගයන්ගෙන් වසලයෙකු වන බව දේශනා කර ඇත.

ලෝකයේ මානව ආපදාවන් විසින් මහා විනාශයන් සිදුවීම විෂයෙහි බලපා ඇත්තේ මෙම ද්වේෂ සහගත මානසිකත්වය යි. පටු ආකල්ප මත ලෝකය දෙස බලන්නට මෙන් ම ලෝකය ග්‍රහණය කරගන්නට යෑමේ දී සමාජමය වශයෙන් ගැටුම් නිර්මාණය වේ. දේශනාවේ දස ආකාර කෝපයන් ගැන සඳහන්වේ.[31] 'අසවලා මට අවැඩක් ම කළේය. දැනුදු කෙරෙයි. මතුදු එසේ ම කරනවා ඇත. මාගේ හිතවත් මිතුරාට අවැඩක් ම කළේය. දැනුදු කෙරෙයි..... මාගේ සතුරාට වැඩැක් මැ කළේ ය. දැනුදු කෙරෙයි.....' ආදී වශයෙන් තමන් හෝ අනුන් පිළිබඳ ආකල්පයන්ගෙන් ද්වේෂයත් එනිසා ම විවිධ ආපදාවන් ද පුද්ගලයාත් සමාජයත් පෙළයි.

මෝහය නම් මුළාව; අවිද්‍යාව; මෝඩකම; නොදැනීම වේ.[32] ලෝකය හා සත්ත්වයා පිළිබඳ වූ යථා ස්වභාවය ආවරණය වීමෙන් අවබෝධ නොවූ විවිධ ආපදාවන් කෙරෙන් නැඹුරු බව ම මෙහි මෝහය යි. අටුවා විවරණය අනුව අරමුණු විෂයෙහි මුළාවීම් මාත්‍රයෙන් ද මෝහය නම් වේ.[33] එවිට සාමාන්‍ය මනුෂ්‍ය සිතෙහි උපදින 'මානය' විවිධාකාර ය. තමන්ටත් අනුන්ටත් දුක් විපත් පිණිස වන අනවබෝධ මානසික තත්ත්ව අතර 'ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමි. ශ්‍රේෂ්ඨයාට සමාන වෙමි. ශ්‍රේෂ්ඨයාට හීන වෙමි.....'[34] යනාදී නවවිධ මානය වේ.

> මුළාබව ඇතිකල්හි යථාස්වභාවය තත් වූ පරිදි දකින ප්‍රඥාචක්ෂුසයෙහි අන්ධ භාවය කිරීම, ලකුණු කොට සිටියේ ය. නොහොත් ප්‍රඥාවට ප්‍රතිපක්ෂභාවය, ලකුණු කොට ඇත්තේය. කෘත්‍යය, පිළිවිඳ දැනීමෙහි අපොහොසත් බවයි. නැත, ආරම්මණස්වභාවය වසා දැමීම යි. දුෂ්ප්‍රතිපත්තියට අභිමුඛවීම හෝ ප්‍රඥාචක්ෂුසයෙහි අන්ධභාවය කිරීම....'[35]

යනාදි වශයෙන් දක්වෙන්නේ මෝහයෙහි ලක්ෂණය යි. දේශනාවේ තවදුරටත් පැහැදිලි කරන්නේ, 'මෝහය මහාසාවiය, වහා පහනොවන බවයි.[36] එහෙයින් පුද්ගල මනසෙහි වඩාත් විපත්තිකර තත්ත්වය ලෙස මුළා බව ම දක්නට ලැබේ.

ත්‍රිවිධ විපත්තීන් අතර චිත්ත විපත්තිය හා දෘෂ්ටි විපත්තිය වශයෙන් මානසික වූ කාරණාවන් දෙකකි.[37] අවිද්‍යාව බහුලවීම හේතුවෙන් ව්‍යාපාදය බහුලවීම නිසා චිත්ත විපත්තිය වේ. අවිද්‍යාවෙන් ම උපදින කම්ඵල අවිස්වාසය ආදී මානසික තත්ත්වය දෘෂ්ටි විපත්තිය යි. මෙයින් ද අනාවරණය වන්නේ අනවබෝධය (මෝහය) පූර්වාඞ්ගම



වූ මානසික තත්ත්වය විසින් පුද්ගලයා විපත්තිකර තත්ත්වයට පත්වන බව යි.

ඉහත දැක් වූ ලෝභ, දොස, මොහ යන ත්‍රිවිධ අකුසල මූලයන් පුද්ගලයාටත් පුද්ගලයාගෙන් සමාජයටත් ආපදා සහගත වන්නේ ය.

> 'පුද්ගලයා ලෝභයෙන් උපන් පාපක අකුසල ධර්මයන්ගෙන් මඩනාලද්දේ එයින් ම ඇදගත් සිතැත්තේ ඉහාත්මයෙහි ම වෙහෙස ඇති උපායාස ඇති පරිදාහ ඇති දුකින් වසන්නේ ය. .... ද්වේෂයෙන් හටගත්.... මොහයෙන් හටගත් පාපක අකුසලධර්මයෙන් මඩනා ලද්දේ ඇදගත් සිතැත්තේ ඉහාත්මයෙහි ම විඝාත සහිත උපායාස සහිත පරිළාහ සහිත දුකින් වෙසෙයි.....'[38]

යනුවෙන් පුද්ගල මනස ත්‍රිවිධ අකුසල මූලයන්ගෙන් මඩනා ලද්දේ වෙයි. පොදුවේ උපතින් ම පවත්නා සාමාන්‍ය ස්වභාවය එය යි. එනිසා ම පුද්ගලයාටත් සමාජයටත් ආපදා ඇතිවීමේ මූලහේතු වන්නේ මෙම ක්ලේෂකර මානසිකත්වය යි.

පෘථග්ජන සිතෙහි බලපවත්වන අගතීන් සතරක් ගැන දේශනාවේ සඳහන්වේ. අගති නම් පක්ෂග්‍රාහී වීම හෝ වැරදි ක්‍රියාවන් ය.[39] ලෞකික ජීවිත ගත කරන පුද්ගලයා තුළ මානසික වශයෙන් බලපාන එවැනි තත්ත්ව හතරක් අගති වශයෙන් බුදුදහම පෙන්වා දෙයි. ඡන්ද, දෝෂ, භය හා මෝහ යනු නොපැමිණිය යුතු සතර අගතීන් ය.[40] මිනිසුන් තමන්ටත් අනුන්ටත් අහිත පිණිස වූ අපදාවන්ට හේතු වන දෑ කෙරෙන් පෙළඹෙන්නේ මෙකී අගතිගාමී මානසිකත්වය නිසා ය. බුදුදහම එවැනි මානසිකත්වය පිළිකුල් කරණුයේ සියලු ආකාරයෙන් ම පුද්ගලයාට හානිකර තත්ත්වයක් වන බැවිනි.

ඡන්දගතිය නම් ආශාව නිසා යුක්තිය ඉක්මවා අගතියට යෑම යි. යම් දෙයකට හෝ කෙනෙකුට ඇති දැඩි ඇල්ම යි. අටුවාචාරීන් වහන්සේලා එය නිර්වචනය කරන්නේ, 'යහපත්වූ හෝ අයහපත්වූ හෝ යමක් කරන කියන අවස්ථාවක යම් ආශාවක් ඇතිවේ නම් ඊට ඡන්දය යි කියනු ලැබේ. ඒ මේ අදහසකින් යුක්තව නොකටයුතු අදහසකට පැමිණියේ නම් එය ඡන්දගතිය නම් වේ'[41] යනුවෙනි. එයින් ද පුද්ගලයාටත් සමස්ත ප්‍රජාවටමත් විපත්තිකර තත්ත්වයක් උදවේ. ගණ්ඩතිණ්ඩු ජාතකය පඤ්චාල නුවර රජු ඡන්දයෙන් අගතියට ගොස්

අධර්මයෙන් රට පාලනය කිරීම නිසා රටටත් සමාජයටත් විපත් පැමිණි ආකාරය පැහැදිලි කරයි.[42]

ලෝභ සහගත සිතැත්තා සම්පත් පරිභෝජනයේ දී අගතිගාමී වීම, පරහිතකාමී නොවීම, ආත්මාර්ථකාමී වීම, සදචාර සීමාවන් ඉක්ම වීම, උපේක්ෂාවෙන් තොර වීම ආදී දුර්ගුණ ප්‍රකට කරන බැවින් තමන්ටත් අනුන්ටත් අහිත පිණිස වූ ආපදවන් උද කරයි. බුදුන් වහන්සේ අපුත්තක සිටුවරයාට දැඩිතණ්හාවෙන් පෙළෙන සිතින් උපභෝග, පරිභෝග සම්පත් කෙරෙන් ඇලුණු තැනැත්තා සීමාන්තික ලෙස සම්පත් පරිභෝජනය හා ඒවාට ඇලීම කරණකොට ගෙන පරහටත් තමන්ටත් විපත් පමුණුවා ගන්නා බව පෙන්වා වදාළහ.[43]

ද්වේෂය අකුසල මූලයකි. එහෙයින් බුදුදහම කවර තරමකින්වත් නොඅගයන මානසිකත්වයක් ලෙස ද්වේෂය දක්වයි. එය අගතියක් වශයෙන් පුද්ගල මනසෙහි ක්‍රියාත්මක වීම සියලු දෙනාට ආපද සහගත ම වේ. ද්වේෂය අගතියක් වශයෙන් අටුවාව විග්‍රහ කරන්නේ 'ද්වේෂ කෙරේනුයි ද්වේෂ නම්. ක්‍රෝධ කිරීම ලක්‍ෂණ කොට ඇත්තේ හෝ ද්වේෂය ස්වභාව කොට ඇත්තේ ද්වේෂය නම්. ඒ මේ කිපීමෙන් යුක්තව නොකටයුතු ස්වභාවයකට පැමිණීම දෙෂාගතිය නම් වන බවයි.'[44] මේ අනුව ද්වේෂය සිත්හි අගතියක් වන කල්හි එය සමස්තයට ආපද සගත වන්නේ ය.

සමනයට පත්වන්නට නොම දී ද්වේෂය වඩන තැනැත්තේ විපත්තිකර තත්ත්වය ම පෝෂණය කරයි. සිත, කය සහ වචන යන තිදොරින් අන්‍යයන් හා ගැටීම නිතර ස්වභාව කොටගන්නා බැවින් වෛරී චේතනාව නොසිඳෙන්නේ ය.[45] එමගින් තමන්ගේ පරිහානිය මෙන් ම අන්‍යයන්ගේ විනාශය ද වන්නේ ය. මෙලෙසින් දුරාචාරයන්ගේ මූලබීජයන් සිය සන්තානයෙන් ම උපදී.

යමෙකුට හෝ යම් දෙයකට ඇති බිය නිසා පක්‍ෂග්‍රාහී වීම හෝ ගැතිකම් කිරීම භයාගතිය වේ. බිය හෝ බියෙන් යුක්තවීම භය නම් වේ. ඒ මේ භය ගතියෙන් යුක්තව නොකටයුතු ස්වභාවයකට පැමිණීම ද භයාගතිය නම් වන බව පවසයි.[46] සමාජයේ කවර තරමක අයෙකු වුව ද බියෙන් අගතිගාමීව කටයුතු තරන්නේ නම් ඒ කිසිදු ක්‍රියාවකින් යහපත් ප්‍රතිඵලයක් අපේක්‍ෂා කළ නොහැක. එයින් සිදුවන සියලු ක්‍රියා ඔහුටත් වෙනත් කවරෙකුට හෝ කවර තරමක හෝ ආපදවක් ම ඇති කරන්නේ ය.



> 'බියෙන් තැතිගත් මිනිස්සු පර්වතයන් හා වනයන් ද
> ආරාම, රුක්, දෙවොල් ද පිහිට කොට යෙති., ....මේ
> සරණ ගොස් සියල් දුකින් මිදීමට නොහැකි ය.'[47]

යනුවෙන් සාමාන්‍ය මිනිස් සිතෙහි බිය පවතින බවත් ඒ මත පදනම්ව අභිචාර ආදී වූ විවිධ දුක් සහගත තත්ත්වයන් විෂයෙහි පෙළඹෙන ආකාරයත් බුදුන් වහන්සේ පෙන්වා වදාළහ. මූලික වශයෙන් සාමාන්‍ය ඉන්ද්‍රිය විෂය සීමාවේ දී හඳුනාගත නොහැකි සීමාවන් කෙරෙන් බිය පක්‍ෂපාත බව පුද්ගලයා විවිධ නිරර්ථක දෑ කෙරෙන් පොළඹවන්නට හේතු වන්නේය.

සතර අගතීන්හි සිව්වැන්න මොහාගතිය යි. අටුවාචාරීන් වහන්සේලා විග්‍රහ කරණ ආකාරයට මුළාවීම මෝහය නම්. මුළාවීම ලක්‍ෂණ කොට ඇත්තේ හෝ මුළාවීම ස්වභාව කොට ඇත්තේ මෝහ නම්. ඒ මේ මෝහයෙන් යුක්තව අකටයුතු ස්වභාවයට පැමිණේනුයි මෝහාගතිය නම්.[48] මේ අනුව මිනිසා විසින් කළයුත්ත නොකළයුත්ත වටහාගත නොහැකි තත්ත්වයට පත්වීම හා සාවද්‍ය චර්යා ධර්ම ප්‍රකට කිරීම මෝහය නිසා නිරායාසයෙන් ම සිදුවන බව පැහැදිලි ව පෙනෙන යථාර්ථය යි. මෙය පුද්ගලයාට මෙන් ම සමස්ත සමාජයටත් විවිධාකාරයේ ආපදවන් ඇතිවීමට හේතුකාරණා වෙයි.

පුද්ගලයාගේ මානසිකත්වය සියල්ලට හේතු වන බැවින් සතර අගතීන් වෙසෙසින් ම හානිකර වූවකි. එයින් ද පූර්වෝක්ත අගතීන්ට පත්වීම සඳහා බලපාන මූලික මානසික හේතුව මෝහාගතිය යි. මේ අනුව අගතීන්ට පත්වන තැනැත්තා අවපක්‍ෂයේ චන්‍ද්‍රයා මෙන් දිනෙන් දින පරිහානියට පත්වන්නේ ය. මෙයින් පෙනී යන්නේ පුද්ලයාට ආපද ඇතිවීම උදෙසා සතර අගතීන් ද මානසික කාරණා වශයෙන් ඉවහල්වන බවයි. බුදුන් වහන්සේ ත්‍රිවිධ විපත්තීන් පිළිබඳ ව පැහැදිලි කිරීමේ දී ද චිත්ත විපත්තිය හා දෘෂ්ටි විපත්තිය මානසික වශයෙන් පුද්ගලයා පරිහානියට පත් කරන බව පැහැදිලි කර ඇත. තවද යථෝක්ත සන්තානගත සෘණ භාවයන් පදනම් කරගත් විවිධ මානසික තත්ත්වයන් සූත්‍ර දේශනාවන්හි විස්තර කෙරේ. අනුමාන සූත්‍රයේ පුද්ගලයාට විපත් කරන එවැනි මානසික තත්ත්වයන් රැසක් දක්නට ලැබේ. ඒවානම්,

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015

1. ලාමක අදහස් ඇති බව
2. තමන් උසස් කොට අනුන් පහත් කොට සැලකීම.
3. ක්‍රෝධ කරන සුලු වූයේ ක්‍රෝධයෙන් මඩනා ලැබීම.
4. ක්‍රෝධ කරන සුලු වූයේ ඒ හේතු කොට බද්ධ වෛරයෙන් යුක්තවීම.
5. ක්‍රෝධ කරන සුලු වූයේ ඒ හේතු කොට ගැටෙන සුලු වීම.
6. ක්‍රෝධ කරන සුලු වූයේ ඒ හේතු කොට ක්‍රෝධ වදන් කීම.
7. චෝදනා කරන විට චෝදකයාට ප්‍රතිවිරුද්ධ චෝදනා කිරීම.
8. චෝදනා කරන විට චෝදකයා හා ගැටීම.
9. චෝදනා කරන විට චෝදකයාට පෙරළා චෝදනා කිරීම.
10. චෝදනා කරන විට චෝදනාව අනිකකින් වැසීම.
11. චරිත ශුද්ධිය නොමැතිකම.
12. ගුණමකු වීම.
13. ඊර්ෂ්‍යා කිරීම, මසුරු වීම.
14. කෛරාටික වීම මායා ඇති වීම.
15. තද බව ඇත්තේ අධික මානය ඇතිවීම.
16. සිය දෘෂ්ටිය ම පරාමර්ශනය කරන්නේ එය ම දැඩි කොට ගන්නේ බැහැර කරන්නට නොහැකි වීම,[49] වේ.

මේ ආදී වූ මානසික තත්ත්වයන් පුද්ගලයාගේ දුර්වලභාවය කරන ධර්මයන් ය. එවැනි මානසික තත්ත්වයක් විසින් මෙහෙය වන්නෙකුගෙන් සාමාන්‍ය ස්වභාවයක් අපේක්ෂා කළ නොහැක.

මානසික වශයෙන් සංයමයක් නොලද පුද්ගලයා ලෝකය හා සත්ත්වයා පිළිබඳ උපේක්ෂාවෙන් නොබලයි. එවන් මානසිකත්වයක් ඇති පුද්ගලයා අධික හෝ සීමාන්තික අරමුණු විෂයෙහි ක්‍රියාත්මක වේ. එහි ප්‍රතිඵලය වන්නේ කායික හෝ වාචසික සකලවිධ ක්‍රියාකලාපයන් පුද්ගලයාගේ පරිහානියට හේතුවේ. එය ම සමාජයට ආපදා සහගත වන්නේය.



## චර්යාත්මක හේතු

පුද්ගල චර්යාවන් හෙවත් ක්‍රියාවන් සහ ඒවාට හිමිවන විපාක පිළිබඳ ව ආගම්-දර්ශන විවිධ අදහස් ඉදිරිපත් කරන්නේ 'කර්ම සංකල්පය' පදනම් කරගෙන යි. බුද්ධදහම කම්මවාදී හෙවත් කිරියවාදී දහමකි. ඒ අනුව 'කම්ම' (සං. කර්ම) බෞද්ධ සූත්‍ර දේශනාවන්හි ප්‍රධාන වශයෙන් අර්ථ දෙකක යෙදේ. එනම්, ක්‍රියාව යන අර්ථය සහ ක්‍රියාවක් සිදුකිරීමෙන් පසුව ඒ පිළිබඳ ව ඇතිවන යම් බලවේගයක පැවැත්ම යි.[50] මනසෙහි ආධිපත්‍යය තහවුරු කරමින් ඉදිරිපත් කෙරෙන බෞද්ධ කර්ම වාදය මනෝ විද්‍යාත්මක, ආචාර විද්‍යාත්මක මෙන් ම පාරභෞතික පදනමක දේශනා කෙරේ.

බුදුන් වහන්සේ 'චේතනාව ම මහණෙනි මම කර්මය යැයි කියමි'[51] යනුවෙන් කළ දේශනාව ලෝක ආගමික ඉතිහාසයේ මනසෙහි ප්‍රධානත්වය මෙන් ම පුද්ගල අධිකාරය තහවුරු කළ සුවිශේෂ අවස්ථාවකි. මහාචාර්ය ඩබ්. එස්. කරුණාරත්න එය විග්‍රහ කරන්නේ 'මිනිස් සිත සතු මූලික කර්තව්‍ය තුනකි. සංවේදනය, සංජානනය හා සංචේතනය නමින් මෙකී කර්තව්‍යත්‍රයය නම් කළ හැකිය. සංවේදනය යනු හැඟීම් පද්ධතිය යි. සංජානනය යටතේ සියලු දැනීම් ඇතුළත්වේ. සංචේතනය යන්නෙන් උත්සාහය, මෙහෙයවීම, අභිසංස්කරණය හා ආයූහනය ගම්‍ය වේ. මෙම අර්ථයෙන් ගැනෙන සංචේතන කෘත්‍යය බුදුහු කර්ම වශයෙන් හඳුන්වති.'[52] යනුවෙනි. එමෙන් ම බෞද්ධ කර්ම වාදය ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයේ ආචාර විද්‍යාත්මක ප්‍රයෝගයක් වශයෙන් ද හෙතෙම හඳුනා ගනී.[53]

මෙම කර්ම චේතනා පූර්වාංගමව සිත, කය හා වචන යන තුන් දොරින් ම සිදුවේ.[54] මේ අනුව පුද්ගලයා දැනුවත්ව සිදුවන කර්ම විෂයෙහි හෙතෙම වගකිව යුතුවේ. තවත් ලෙසකින් කර්මයෙහි අධිපති බව බුද්ධදහම පිළිගන්නා නමුත් පුද්ගල චර්යාවන් නියති වාදයකට යටත් නොකරයි. එනිසා ම බුදුන් වහන්සේ කම්මවාදී හා කිරියවාදී වන බව සූත්‍රාන්තයන්හි දක්වේ.[55]

කර්ම විපාක දීම ගැන පැහැදිලි කිරීමේ දී සාංසාරිකව කරන ලද කුසලාකුසල කර්ම ශක්තිය පුද්ගලයාට බලපාන බව පිළිගනී. ඥානමීමාංසාත්මක පදනමක ගොඩනැගෙන බෞද්ධ ආචාර ධර්ම සහ සියලු ඉගැන්වීම් කම්ඵල ඇදහීම මුල්කොට පවතී. උපදින සියලු දෙනා ම කර්ම ශක්තියෙන් උපදින්නේ ය. එමෙන් ම උපන් සියලු සත්ත්වයෝ

කර්මය කරපින්නා ගෙන සිටී. කර්මය ඥාති කොට කර්මය පිළිසරණ කොට සිටින්නේ යැ [56] යි, දක්වෙන දේශනාවට අනුව යමෙක් පාප කර්ම බහුල කොට උපන්නේ නම් හෙතෙම දුක් සහගත උත්පත්තියක් ලබයි. පෙර පින්කම් කොට පින් බහුලව උපදින්නේ ලෞකික සැපසම්පත් ලබයි. ධම්මපදයේ පළමු ගාථාද්වය විසින් '...තතො නං දුක්ඛමන්වෙති චක්කංව වහතොපදං' [57] සහ '...සුඛමන්වෙති ඡායාව අනපායිනි' [58] යනුවෙන් දූනුවත්ව අපිරිසිදු සිතින් කරණ ක්‍රියාවන්හි විපාක ආපද සහගත ලෙසත් පිරිසිදු සිතින් කරන ක්‍රියා විපාක සුඛ සහගත ලෙසත් ඵල ගෙන දෙන බව පවසයි. ආචාරාත්මක පදනමක සාකච්ඡා කෙරෙන බෞද්ධ කර්ම වාදයේ පුද්ගල චර්යාවන් මත සුඛ-දුක්ඛ විපාකයන් හිමි වන බව පැහැදිලි කරයි. එහෙත් 'මොළිය සීවක සූත්‍රයේ' දී බුදුන් වහන්සේ පුබ්බේකත හේතුවාදය විවේචනය කරමින් රෝග වේදනා සහිත ආපද සඳහා බලපාන හේතූන්ගෙන් එකක් ලෙස පමණක් කර්ම විපාක ද ඇති බව දේශනා කර තිබේ.[59]

පංච නියාම ධර්ම යටතේ කම්ම නියාමය ලෙස අටුවාචාරීන් වහන්සේලා විග්‍රහ කරන්නේ ද පුද්ගල චර්යාවන්ගෙන් ගොඩනගන කර්ම ශක්තියෙහි බලපෑමයි. 'කුසලයට යහපත් විපාකයක් දීමත් අකුසලයට අයහපත් විපාකයක් දීමත් යන මෙය කර්ම විපාකය යි,'[60] සුමඞ්ගලවිලාසිනි විග්‍රහය යි. එයින් ද ගම්‍යවන්නේ පුද්ගල කර්ම ශක්තිය ද විවිධ විපාක විෂයෙහි බලපාන බවයි. ගිරිමානන්ද සූත්‍ර දේශනාවේ දී කර්ම විපාක (කම්මවිපාකජා ආබාධා) වශයෙන් සහ විෂමපරිහාරයෙන් වන ආබාධ (විසමපරිහාරජා ආබාධා) පිළිබඳ ව දේශනාකර තිබේ. [61] මනෝරථපූරණී අටුවාව බලවත් කර්ම විපාක වශයෙන් උපදින ආබාධ සහ කායික වශයෙන් වැරදි ලෙස පිහිටීම හෙවත් පරිහරණය නිසා උපදින ආබාධ වශයෙන් ඒවා හඳුනාගනී.[62] මිනිසා විසින් සාංසාරිකව හෝ ලෞකික වශයෙන් කරන හොඳ හෝ නරක කර්ම විසින් හොඳ හෝ නරක කර්ම විපාක ගෙන දෙයි. ධම්මපදට්ඨ කතාවේ එන නිදනයන් වන චක්ඛුපාල තෙරුන්ගේ කතාව [63] සහ මට්ඨකුණ්ඩලීගේ කතාව [64] පෙර භවගාමී කර්ම හා මෙලොව වශයෙන් කරන කර්ම ශක්තීන්හි ඵලවිපාක පිළිබඳ ව පැහැදිලි කරයි. දිට්ඨධම්මවේදනීය වශයෙන් කර්ම විපාක දීම කොකාලික භික්ෂුව ආර්යෝපවාදයෙන් ශරීරය ගෙඩි මෙන් පිළිකා ඇතිව මිය යෑම මෙනි.



පුද්ගලයා මුහුණ දෙන විපත් ඇතිවීම සඳහා බලපාන හේතු කාරණා අනුව ආපදා තුනක් ගැන ද සඳහන්වේ. එනම්, කර්මාන්ත විපත්, ආජීව විපත් සහ දිට්ඨි විපත් ය.[65] කර්මාන්ත විපත් නම්, පුද්ගලයා විසින් ප්‍රාණඝාත, සම්ඵප්‍රලාප ආදී කායික හා වාචසික වශයෙන් කරනු ලබන කර්ම යි.[66] එයින් සිදුවන 'ඵරුසං වෙදනං' දරුණු වේදනා නම් වූ පහර වැදීම්, අත්-පා කැඩීම්, කැපීම් වසයෙන් සිරුරට ඇතිවන කටුක වේදනාවන් මෙන් ම 'සරීරස්ස භෙදනං' සිරුර බිඳීමය. ඔළු පැළීම්, අත්-පා විනාශයෙන් වන සිරුරැ නැසීම දස වැදෑරුම් විපත් කරුණුවලට අයත් වේ.[67] තවද මිච්ඡා වාචාව සහ මිච්ඡා කම්මන්තය විපත්තිකර වන ආකාරය පෙන්වා දී ඇත. ඒ අනුව සියලු දුසිරිත් සිද්ධ කෙරෙන දොරටු අනුව කායික, වාචසික හා මානසික වශයෙන් තුන් ආකාර වන බව දීඝ නිකායේ සඞ්ගීති සූත්‍රයෙහි දක්වේ.[68] විටෙක මිනිස චර්යාවන් මිනිසුන්ට විවිධ හානි පමුණුවන්නේ ය. පුද්ගල ක්‍රියාවන් පිළිබඳ වගකීම් විරහිත චර්යාධර්මයන්හි ප්‍රතිඵලය එයයි.

ආජීව විපත් නම් ජීවිකාව වෙනුවෙන් ඍජු හෝ වක්‍ර ලෙස තමන්ට හෝ අනුන්ට හානිකර වූ ජීවිකා වෘත්තීන්හි නියැලෙන්නේ නම් එය යි. වණිජ්ජා සූත්‍රයෙහි ජීවිකාව වෙනුවෙන් නොකළයුතු වෘත්තින් පහක් ගැන සඳහන් කර තිබේ. ඒවා නම්, අවි වෙළඳාම, සත්තු හෝ මිනිසුන් වෙළඳාම, මස් වෙළඳාම, මත් පැන් හෝ මත් ද්‍රව්‍ය වෙළඳාම සහ විස වෙළඳාම යි.[69] ලෝකයේ මිනිසුන් විසින් ඇතිකරන ආපදා (man made disasters) සඳහා එකී ජීවිකා වෘත්තීන් ඉවහල් වන්නේ ය. මුදල් වෙනුවෙන් අවි-ආයුධ නිෂ්පාදනය හා වෙළඳාම නිසා මිනිසුන් තමන්ගේ ශක්තිය එය ලෙස සලකා යුද්ධ වැනි ආපදාවන් නිර්මාණය කර තිබේ. වහල් සේවය වෙනුවෙන් මිනිසුන් යොදා ගැනීම නිසා ද මිනිසුන් අතර පරතරය ආරක්ෂා කරන්නට සිතන නිසා මානව ගුණාංග ගිලිහී යන්නේ ය. මානසික වශයෙන් ආත්මාර්ථය පෙරටු කොටගත් මනෝභාවයන් ප්‍රකට වන්නේ ය.

අද ලෝකයේ මානව සම්පත මුහුණ පා සිටින ආපදාවන්ගෙන් භයානක ම ආපදාවක් වන්නේ මත්ද්‍රව්‍ය උවදුරයි. එය මිනිසුන් කායික මෙන් ම මානසික වශයෙන් ද පරිහානියට ඇගෙන යමින් පවතී. සොරකම, මංකොල්ලය මෙන් ම සාහසික අපරාධ සඳහා ද පුද්ගලයා පොළඹවන්නට එය ඉවහල්වී තිබේ. ස්වභාව ධර්මය ඉක්මවා ගොස් ආයෝජනය කරන්නට කල්පනා කිරීම නිසා සියලු දේ වෙනුවෙන්

වස-විස භාවිත කිරීම අතිශය විපත්තිකර වන්නේය. ස්වභාව ධර්මය අසමතුලිත වීමත්, ඒවා මගින් නිෂ්පාදනය වන දෑ නිසා සත්ත්වයින්ට රෝගාබාධ වැනි ආපදාවන් ද ඇතිවේ. ලොව මානව ආපදාවන් විෂයෙහි පූර්වෝක්ත අධාර්මික ආයෝජන මාර්ග ඉවහල් වන බව නොරහසකි.

බ්‍රහ්මජාල සූත්‍ර දේශනාවේ දී මිනිසුන් විවිධ දූර්මත ගන්නා ආකාරයත් ඒ හා සමග ආකල්පමය වශයෙන් පිරිහෙන ආකාරයත් පැහැදිලි කරයි.[70] සාමාජික වශයෙන් ආපදා ඇතිවීම විෂයෙහි පුද්ගල ආකල්ප බෙහෙවින් බලපායි. අකිරියවාද, උච්ඡේදවාද, අමරාවික්ෂේපවාදය හෝ නියතිවාද ආදී දෘෂ්ටිවාද ගැනීම නිසා විවිධ අන්තයන් කරා ගමන්කරයි. එය නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාවලියේ දී සදාචාර සීමාවන් ඉක්මවා යන්නේ ය. එය ම මානව ආපදාවක් වන්නේ ය.

පුද්ගලයාට ආපදා ගෙන දෙන කාරණාවන් අතර සීල විපත්තිය ද වේ.[71] ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර ආදී සදාචාර විරෝධී කාරණාවන් මෙයින් අර්ථවත් වේ. තව ද දීඝ නිකායේ දුසිල් බවේ ආදීනව ගැන කියැවේ. භෝග සම්පත් පරිහානිය, අගුණ පැතිරීමාදී කාරණා පහකි.[72] සීලයෙන් පිරිහෙන පුද්ගලයා තමන්ට මෙන් ම අන්‍යයන්ට ද විපත් ඇති කරන්නේය. සහජයෙන් ම නොහික්මුණු ගති ස්වභාව ඇති මිනිසා ආචාරධර්මීය වශයෙන් පාලනය කරන්නේ ශීලයෙනි. කායික හෝ මානසික සුවපහසුව වෙනුවෙන් මිනිසා කොපමණ දෑ ලද නමුත් සීලය හෙවත් සදාචාර සීමාවන් ඉක්මවන්නේ නම් එය අර්ථ විරහිත වන්නේය.[73] එහි දී ජාති, කුල, ආගම් හෝ බලය වැදගත් සාධකයක් නොවන බව ද අවධාරණය කරයි.

සමාජ පරිභෝජන රටාව මගින් සුඛෝපභෝගී ජීවිතයක් නිර්මාණය කර ඇත. එමගින් ඍජු හෝ වක්‍ර ලෙස මිනිසාට ආපදා පමුණුවා ඇත. සමාජමය ආකල්ප සීමාන්තික පරිභෝජනය කෙරෙහි යොමු කරවීම ඊට ප්‍රබල ලෙස බලපා තිබේ.

> 'මෑතක දී අත්පත් කරගත් සුඛෝපභෝගී ජීවන රටාව පවත්වාගෙන යෑම සඳහා වැඩි වැඩියෙන් පරිභෝග කළ යුතු බවත්, ..... මිනිස් අභිප්‍රායන් පිළිබඳ ව කර ඇති මනෝවිද්‍යාත්මක පර්යේෂණ මගින් මිනිසාගේ දූර්වලකම් හා නම්‍යතාවන් හෙළිදරව් විණි. එම



> දූර්වලකම් වන සැපයට ඇති ගිජු බව, වස්තු තණ්හාව, සමාජයේ කැපීපෙනීමට ඇති ආශාව....'[74]

ආදී වශයෙන් මානව ආපදාවන් විෂයෙහි මිනිස් ආකල්ප සහ චර්යාවන්හි ප්‍රබල බලපෑමක් ඇති බව නූතන විද්වත්හු ද පිළිගනිති.

'ගිහි විනය' යනුවෙන් පුද්ගල චර්යාධර්මයන්හි වැදගත්කම තහවුරු කරන කාරණා රාශියකි. ඒ අතර අපාය මුඛ වශයෙන් කාරණා හයකි.[75] සදාචාර විරෝධී හැසිරීම් වන ඒවා පුද්ගලයාට ආපදා සහගත වේ. සුරාවට ඇබ්බැහි වීම, අවේලාවේ වීථි සංචාරය, නෘත්‍ය නැරඹීමට යෑම, දූ කෙළිය වැනි සම්පත් පරිහානි කාරණා විසින් ඇතිකරන විපත් බොහෝය. සුරාවට ඇබ්බැහිවීමෙන් ධන විනාශ, කලකෝලාහල, රෝගාබාධ ඇතිවීම වැනි විනාශයන් සිදුවේ.[76] නොකල්හි වීථි සංචාරයෙන්, අනාරක්ෂිත බව, සැක කටයුතු බව ආදීය ද, දූ කෙළියෙන්, සම්පත් විනාශය, අපකීර්තිය, දූක[77] ද, ආදී වශයෙන් විවිධාකාර ආපදාවන්ට ගොදුරු වන්නේ ය. ආචාරධර්මීය වශයෙන් නොහික්මුණ පුද්ගලයා නිරායාසයෙන් ම අන්‍යයන්ගේ හිංසා පීඩාවන්ට පත්වේ. වෙසෙසින් ම පුද්ගල වැරදිවලට රජුන් විසින් දඬුවම් පැමිණවීම ද මහත්වූ ආපදාවක් වන්නේ ය.[78] බාලපණ්ඩිත සූත්‍රයෙහි විවිධ දඬුවම් ක්‍රම රැසක් ගැන සඳහන්වේ.

> 'රජදරුවෝ අපරාධකාරී සොරුන් ගෙන විවිධ කම්කටොළු කෙරෙත් ද, කසයෙනුදු තලණුවන්, වේවැලෙනුදු තලණුවන්, අඩදඬියෙනුදු තළණුවන්, අත ද සිඳිණුවන් පය ද සිඳිණුවන්, අත්පා ද සිඳිනුවන්.... සුනඛයන්ලවා කවනුවන්, දිවැස්හුල හිඳුවනුවන්, කඩුවෙනුදු හිස සිඳිනුවන් දක්නේ වේ ද'යි දූක්වේ.[79]

මෙම කාරණා සියල්ල පුද්ගලයෙකුට පමණක් නොව සමස්ත සමාජයට ම විවිධ ආකාරයේ ආපදා සහගත වන්නේ ය.

වර්තමාන ලෝකයේ මිනිසුන් කායික හා මානසික වශයෙන් පීඩාවන්ට පත්වීමට බලපා ඇති කාරණාවන් අතර අධික ආහාරය, වස්තුව සොයා යෑමේ දී ඇතිවන තරඟය හා ආයාසය, ව්‍යායාම් රහිත අලස ක්‍රියාවන්හි යෙදීම, කාමුකත්වය, බීමත්කම, දුම් ඉරීම, ඖෂධවලට

ඇබ්බැහිවීම වැනි ඇතැම් සමාජ ක්‍රියාකාරකම් වේ,[80] යැයි විද්වතුන් පිළිගනු ලබයි.

පුද්ගලයාගේ චර්යාවන් මගින් හෙතෙම ධනවත් හෝ දිළිඳු බවට පත්වේ. බුදුදහමට අනුව දිළිඳු බව ආපදාවකි. නිසිලෙස ආයෝජනයන් නොකරන්නේ නම් හෝ දුරාචාරයන්ට ඇබ්බැහි වන්නේ නම් පුද්ගලයා දිළිඳුවේ. ඒ නිසා ම ණය වන්නට සිදුවේ. ණය වීම දුකකි. ඉණ සූත්‍රය, ණය ගැනීමෙන්, ඒ සඳහා පොළී ගෙවීමත්, ණය නිසා චෝදනා ලැබීමත්, ණය නොගෙවීමෙන් මුදල් හිමියන් ලුහු බැඳීමත්, එයට දඬුවම් ලැබීමත් සිදුවන බව පෙන්වා දෙයි.[81] මෙහි දී බුදුන් වහන්සේ ණයවීම ප්‍රතික්ෂේප කරන්නේ එය පුද්ගලයා බැඳෙන සීමාවේ දී බව මඩිහේ මඤ්ඤාසීහ නා හිමියෝ පෙන්වා දෙති.[82] එම අදහස බුදුදහමට වඩාත් සාධාරණ වන්නේ 'තට මාගේ ණයෙක් නැතැ'යි පලායේ නම් හෙතෙම වසලයෙකැයි.[83] වසල සූත්‍රයෙහි ණය ගැනීම නොව අන්‍යයන්ගෙන් ණය ගෙන නොපියවා මගහැරීම වසල කාරණාවකැයි පෙන්වා දී ඇති බැවිනි.

සමාජමය හා පාරිසරික අර්බුදවලට පුද්ගලයා වගකිව යුතු ය. බුදුදහමට අනුව කම්ඵල ඇදහීමෙන් පුද්ගල චර්යාවන් විනිශ්චය කිරීමේ දී සිත, කය හා වචන යන තිදොරින් තමන්ගේ කායික මානසික පරිහානිය වෙනුවෙන් ක්‍රියා කොට තමන්ට ආපදා පමුණුවා ගැනිමත් සමාජයට හානිකර ලෙස කටයුතු කිරීමත් ආචාරාත්මක ආපදාවන් වේ.

**සමාජීය හේතු**

සමාජ විද්‍යාඥයින්ගේ පිළිගැනිමට අනුව සමාජය යනු හොඳින් ජීවත් වූ සීමාවක් ඇති සමාජ ඒකකයක් ලෙසට ඔවුන් ම සිතන හා ඔවුන් එකට ජීවත්විම තුළින් හා එකට වැඩකිරීම තුළින් සංවිධානය වූ පුද්ගල ඒකකය කි.[84] බුදුදහම සමාජය වශයෙන් හඳුනාගන්නේ මිනිසා සහ මිනිස් ක්‍රියාකාරකම් පමණක් නොවේ. පුද්ගලයා සහ අවට සියලු සජීවී සත්ත්වයින්ගෙන් සමන්විත වූ පුළුල් කුලකයකි. බුද්ධ දේශනාවේ දක්නට ලැබෙන යෙදුම් අතර සබ්බේ සත්තා, සබ්බේ පාණා, සබ්බේ භූතා ආදිය මගින් එම පුළුල් අර්ථය දක්වා තිබේ. තත් සමාජයෙහි මිනිසාට සුවිශේෂ තැනක් හිමිවන බව ද අවධාරණය කර තිබේ. එහිදී විශේෂයෙන් ම පුද්ගලයා සමාජයටත් සමාජය පුද්ගලයාටත් අන්‍යෝන්‍ය වශයෙන් බලපාන බව ද අවධාරණය කරයි. එම ආකල්පයෙන් පුද්ගල



ආපදාවන් විෂයෙහි සමාජීය වශයෙන් ද යම් යම් කාරණාවන් බලපාන බව පැහැදිලි ය. එමනිසා පුද්ගල වෛමත්තතාව සඳහා ආරය, කර්මය හා පරිසරය බල පෑ හැකිබව බුදුදහම පිළිගන්නා බව විද්වත්හු පෙන්වා දෙති.[85] සමාජය මානව අවශ්‍යතාවක් වන අතර ආර්ථික, දේශපාලනික කාරණාවන් ද ඒ හා බැඳී පවති.

බුදුන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍ර දේශනාවේ දී පුද්ගලයා මහා සමාජයෙහි එක් අයෙකු වන බවත් ක්‍රමයෙන් සංකීර්ණ සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරයත් පැහැදිලි කරති. ඒ අනුව පළමුව සමාජයත් එහි දෙවනුව පෞද්ගලිකත්වයත් දක්නට ලැබුණි. එය ක්‍රියාත්මකවීමේ දී සන්තානගත වශයෙන් පුද්ගලයාත් සංස්ථාගත වශයෙන් සමාජයත් වේ. එමගින් බුදුදහම දේව නිර්මාණවාදය ප්‍රතික්ෂේප කරන අතර ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායට අනුව සමාජය හා පුද්ගලයා ක්‍රියාත්මක වන ආකාරය ම තහවුරු කරයි.

පුද්ගලයන් විසින් තැන්පත් කළ ධනය ලබාගන්නට නොහැකිවනසේ වංචනිකයන් විසින් මූල්‍ය ආයතන විනාශ කිරීම, (නිහිතං වා නාධිගච්ඡන්ති) කර්මාන්ත ආදියට මුදල් ආයෝජනය කළ පසු සේවක වැඩ අත්හැරීමාදියෙන් විනාශවීම, (දුප්පයුත්තා වා කම්මන්තං ජහන්ති)ධනය, සම්පත් වනසන කෙනෙක් පවුලක ඉපදීම, (කුලානං වා කුලංගාරෝ උප්පජ්ජති) යනාදී සමාජ ප්‍රශ්න නිසා ද පෞද්ගලික හා ජාතික තලයේ අආපදාවන් ඇතිවේ.

ආපදා ඇතිවීම සඳහා පුද්ගලයා සමාජයටත් සමාජය පුද්ගලයාටත් බලපාන ආකාරය දේශනාවන් මගින් පැහැදිලි කරයි. සමාජ පරිණාමය ගැන පැහැදිලි කරන අග්ගඤ්ඤ සූත්‍රය පුද්ගලයා ආත්මාර්ථය අරමුණු කොට ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සම්පත් විසමතාවත් ඒ අනුව සමාජ විසමතාවත් ගොඩනැගුන ආකාරය පෙන්වා දෙයි.

> අපි හැල් (අප අතර) වෙන වෙන ම බෙදා ගන්නේ නම්, සීමා පනවා ගන්නේ නම් මැනැවැ'යි මෙසේ කතා කරගත්හ. පසුව එම සත්ත්වයෝ හැල් බෙදූහ. එ කල්හි ලොල්පියෙවි ඇති එක්තරා සත්ත්වයෙක් සිය කොටස රැකගනුයේ තමාට නොදෙන ලද එක්තරා කොටසක් ගෙන පරිභෝග කළේය.... යළිත් මෙබන්දක් නොකරව යි කීහ. කෙනෙක් අතින්,

කැටින්, දණ්ඩෙන් පහළහ. එතැන් පටන් ප්‍රාණඝාතය,
ගැරහුම්, මුසාව, දඬුගැනීම විය.[86]

සමාජයේ මූලාරම්භය කෙසේ වුව ද පුද්ගලයා සමාජයේ ක්‍රියාත්මක වීමේ දී උපන් විවිධත්වය මත මානව ආපදාවන් ඇතිවිය. එයින් පෙන්වා දෙන තවත් කාරණාවක් නම් ලොව පටන්ගත් මුල් අවධියේ දී සත්ත්වයා යහපත් සිතුවිලි හා ගුණධර්මවලින් සෞභාග්‍ය සම්පන්නව දියුණු තත්ත්වයක සිට සිතුවිලි හා ගුණධර්මවලින් පිරිහීම නිසා විපත්තිකර දුර්භාග්‍ය සම්පන්න තත්ත්වයට පත්වූ බවයි. එම සූත්‍රයෙහි ම පැහැදිලි කරන්නේ සමස්ත සමාජය දේශපාලනික, ආර්ථික හා ආගමික යන අංශයන්ගෙන් සමන්විත වන බවයි.[87] එනිසා ඒ ඒ අංශයන්ගේ බලපෑම ආපදාවන් ඇතිවීම විෂයෙහි බලපාන්නේ ය.

සමාජයක තීරණාත්මක සාධකය දේශපාලන අධිකාරය යි. බුදුන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී පෙන්වා දෙන්නේ සමාජ සම්මුති න්‍යාය අනුව මානව ශිෂ්ටාචාරයේ බිහිකරගත් ප්‍රධානතම සම්මුතිය එය බවයි.[88] සමාජ සුබාස්වාදනය පිණිස වූ එය ද විටෙක ආපදා සහගත ලෙස පුද්ගලයාට බලපාන්නේ ය.

'....මහණෙනි, යම් කලෙක රජ දරුවෝ අධාර්මික
වෙත් ද එකල්හි රාජ පුරුෂයෝ ද (රාජ නිළධාරීහු)
අධාර්මික වෙත් රාජ පුරුෂයන් අධාර්මික වු කල්හි
බ්‍රාහ්මණ ගෘහපතීහු ද අධාර්මික වෙත්'.[89]

යනුවෙන් වදාළේ රජු රටක මානව හා භෞතික සම්පත් සියල්ල කෙරෙහි බලපවත්වන කේන්ද්‍රීය සාධකය වන බැවිනි. රජු අධාර්මික වුවහොත් රාජ්‍ය පාලනය හා සම්බන්ධ සියලු අංශයන් අඩපණ වේ. රජු නූගත් දුර්වල අයෙකු වන කල්හි සෙසු රාජ්‍ය නිලධාරීන් ද දුරාචාරවලට පෙළඹේ. එය සමස්ත මානව වර්ගයාට පමණක් නොව සමස්ත දේශයට ම අහිතකර ලෙස බලපායි. එය මානව ආපදාවන් ඇතිවීමේ මූල හේතුවකි. ගණ්ඩතින්දු ජාතකයේ දී ද පාලන තන්ත්‍රයේ දුර්වලතාව මත රටකට සිදුවන ව්‍යසනයන් පෙන්වා දී තිබේ.

බුද්ධ දේශනාවෙහි මිනිසුන්ට එළැඹිය හැකි ආපදාවන් පිළිබඳ ව විවිධ අංශයන් මගින් පැහැදිලි කර තිබේ. ඒ අතර මානව ආපදාවන් වශයෙන් රජුන්ගෙන් වන ආපදාවන් ද දක්වා තිබේ.[90] සමාජමය වශයෙන් පුද්ගලයා දේශපාලනය මගින් පිහිටක් ම අපේක්ෂා කරන නමුත් විටෙක පාලකයන් ද ද්වේෂයෙන් හෝ ලෝභයෙන් රටවැසියන්ගේ සම්පත් පැහැරගැනීමාදී විපත් මෙන් ම සොරුන් විසින්



පැහැර ගැනීම් ද වේ.[91] කුල සූත්‍රයේ දී ද රජුන් හා සොරුන්ගෙන් වන විපත් ගැන සඳහන්වේ. එයට අනුව විශේෂයෙන් ම රජුන් අදමිටුවන කල්හි ජනතාවගේ දුරාචාරාත්මක බව ප්‍රකටවනුයේ සොරකම් ආදියෙනි.[92]

පුද්ගලයාට ආපදාවන් ඇතිවීම සඳහා ඔහු ආශ්‍රය කරන සමාජය බොහෝ සෙයින් ඉවහල්වේ. මිනිසා සමාජයීය සත්ත්වයෙකු බැවින් සමාජයක් අවශ්‍ය ය. එය කල්‍යාණ මිත්‍ර ආශ්‍රයක් නොවන්නේ නම් මිත්‍ර ප්‍රතිරූපකයන් නිසා විනාශයට පත්වේ. දේශනාවේ එවැනි විනාශකාරී මිත්‍ර ප්‍රතිරූපකයෝ සතර දෙනෙකු ගැන කියැවේ. එනම්, යමක් ගැනීමට ඇසුරුකරන මිත්‍රයා, වචනයෙන් පමණක් සංග්‍රහ කරන්නා, සියලු ම දේ අනුමත කරන්නා සහ වරදට පොළඹවන්නා ය.[93] එමෙන් ම අසත්පුරුෂයන් ප්‍රිය කිරීම (අසන්තස්ස පියා හොන්ති)[94] පරිහානි කාරණයක් ලෙස ද පරාභව සූත්‍රයේ දැක්වේ.

වානර වස්තුවෙහි[95] දැක්වෙන අසත්පුරුෂයා මෙන් මිත්‍රද්‍රෝහියා අවැඩක් ම පමුණුවන්නේ ය. ඔවුන්ගෙන් යහපතක් අපේක්ෂා කළ නොහැක. නිරන්තරයෙන් අවැඩ පිණිස දැ කරන්නේ ය. එමෙන් ම දුබ්බිට්ඨිමහාතිස්ස කතාවේ[96] මෙන් නොකළයුතු කාර්යයන්හි යෙදෙන සහ අන්‍යයන් ඒ සඳහා පොළඹවන තැනැත්තන්ගෙන් සිදුවන්නේ අනපේක්ෂිත ආපදාවන් ම ය.

පුද්ගලයින්ට දසවැදෑරුම් විපත් කරුණු වේ. ඒ අතර ආපදා පැමිණීමේ දි උපක්‍රමිකව සමාජයෙන් විවිධ කාරණා එළැඹිය හැකිය. 'දාරුනං අබ්භක්ඛානං'[97] වශයෙන් දරුණු බොරු දොස් නඟා කීම, තමා නො ඇසූ නො සිතූ නො දුටු බලගතු අපරාධයන් තමා විසින් කළ සේ දොස් නැගීම් අසන්නට සිදුවීම මහත් විපත්තියක් සේ පෙන්වා දී තිබේ. 'ඤාතීනං පරික්ඛයං'[98] යනුවෙන් විපතේ දී පිහිටවන සතුටේ දී සතුටුවන නෑ හිතවතුන්ගේ පිරිහීම ද සමාජමය වශයෙන් පුද්ගලයා පෙළන්නේ ය.

මේ අයුරින් සමාජමය පුද්ගලයෙකු වූ මිනිසා සමාජය පාලනය කරන්නාසේ ම සමාජය විසින් පුද්ගලයා පාලනය කරනු ලබයි. එනිසා ම පුද්ගල ආපදාවන් විෂයෙහි සමාජයත් සමාජමය ආපදාවන් විෂයෙහි පුද්ගලයාත් වගකිව යුතු වේ. සමාජය හා පුද්ගලයා පාලනය කෙරෙන ප්‍රබල සාධකයන් වන දේශපාලන හා ආර්ථික සාධකයන් මෙන් ම ආගමික මගපෙන්වීම් ද වැදගත්වේ. ඒ අනුව කායික හෝ මානසික වශයෙන් ඇතිවන ආපදාවන් සමාජමය වශයෙන් ඇතිවන ආපදා වේ.



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015

## ස්වාභාවික හේතු

ඒකහේතු වාදයක් නොවන බුදුදහම ලෝකය හා සත්ත්වයා පිළිබඳ වූ කාරණාවන් විෂයෙහි විවිධ හේතුන්ගේ බලපෑම පිළිගනී. කායික හා මානසික වශයෙන් පුද්ගලයාට එළැඹෙන ආපදා සඳහා ස්වාභාවික පරිසරය ද බලපාන බව නූතන වි¡ාව මෙන් ම බුදුදහම ද පෙන්වා දෙයි. ජීවීන්ගේ පැවැත්මට, වර්ධනයට හා ක්‍රියාකාරීත්වයට බලපාන්නා වූ අභ්‍යන්තර හා බාහිර සාධකවල සමස්තය පරිසරය යි. එය ද ස්වභාවයෙන් විවිධාකාර බලපෑම් කරයි. නියාම ධර්ම පිළිබඳ විග්‍රහයේ දී ධම්ම නියාම, උතු නියාම හා බීජ නියාම යනුවෙන් අර්ථවත් කෙරෙනුයේ එය යි.

ධම්ම නියාමයට අනුව පුද්ගලයාට උපතින් ම හිමි වන ස්වභවයන් වේ. ඨාන සූත්‍රයේ දී නිතර මෙනෙහි කළ යුතු ස්වභාවයන් වශයෙන් බුදුන් වහන්සේ ජරා, ව්‍යාධි, මරණ හා ප්‍රියයන්ගෙන් වෙන්වීම වදාළහ.[99] මෙයින් පැහැදිලි වන්නේ උත්පත්තියත් මරණයත් අතර පුද්ගලයාට ස්වභාවයෙන් උරුම තත්ත්වය එමගින් පැහැදිලි කොට ඇති බවයි. කුලසූත්‍රයේ දී ජලය සහ ගින්න මෙන් ම අනිත්‍යතාව නිසා පුද්ගලයාට උරුමවන ස්වභාවය ම අර්ථවත් වේ. ඒ මත පදනම්ව අනේකවිධ දුක්ඛ දෝමනස්සයනට පුද්ගලයා ගොදුරුවන අයුරු නිරන්තරයෙන් බුදුදහම පෙන්වා දෙයි.

'ස්ථිර පැවැත්මක් නැති, නිතර වණයක් මෙන් පවත්නා ශරීරය බොහෝ දෙනා විසින් මනා යැයි සලකා සරසන සිරුර බලන්න.[100] යැයි සිරුරේ ස්වභාය ම වෙනස්වීම, කැඩීම, බිඳීම හා විනාශය වශයෙන් විපත් සහගත වීම බව අවධාරිත ය. තව ද බෙහෙවින් දිරායෑම් ස්වභාව කොට ඇති බැවින් රෝග ණැමති කුරුල්ලන්ට වාසය සඳහා කුඩුවක් බඳු ය. නිතර රෝගයනට පවතින්නට කුඩුවක් වැනියැ යි' පවසා තිබේ.[101]

එමෙන් ම බුදුදහම ජීවත්වන පුද්ගලයාගේ ස්ථිර වශයෙන් සුව නොවන සදාකාලික රෝගයක් වශයෙන් පෙන්වා දෙන්නේ බඩගින්න යි.[102] ධම්මපදයේ සුඛ වග්ගයේ මහත් ම වූ රෝගය සාගින්න බවත් එයින් පෙළෙන කෙනෙකුට ධර්මය වැනි උතුම් දෙයක් වුව දේශනා කිරීමෙන් ඵලක් නොවන බවත් පැහැදිලි කොට තිබේ.[103] මේවැනි දෑ



සාමාන්‍ය මනුෂ්‍ය ශරීරයේ අවශ්‍යතාවන් හා ස්වභාවය හේතුවෙන් උපදින ආපදාවන් ය.

ගිරිමානන්ද සූත්‍ර දේශනාවේ දී බුදුන් වහන්සේ පුද්ගල ශරීරය බොහෝ දුක් සහගත බවත් විවිධ ආබාධ සහිත බවත් ස්වභාවයෙන් බලපවත්වන පිතින්, සෙමෙන්, වාතයෙන් සහ එම කාරණා තුනෙහි එකතුවෙන් වන ආබාධ වශයෙන් ද ස්වභාවයෙන් හටගන්නා විපත් දක්වා තිබේ.[104] ගිරිමානන්ද සූත්‍රයේ ම ඍතු විපර්යාසය (උතුපරිණාමජා) නිසා ද රෝගා දී විපත් වන බව ද දක්වා තිබේ. මේ ගැන විග්‍රහ කරන අටුවාව 'උතුපරිණාමෙන; අච්චුණ්හාසීතෙන (උතුපරිණාමෙන) උප්පජ්ජනක රොගා;'[105] සීතෝෂ්ණාදී ඍතු වෙනස් වීමෙන් උපදින ආපදවන් ම එයින් අදහස් කරන බව පවසයි.

ඍතු නියාමය ද අප ජීවිතයට බලපෑම් කරයි. ඍතු විපර්යාස වන කල්හි ස්වාභාවික පරිසරය ඊට අනුගත වේ. එයින් යම් කෙනෙකුගේ කායික, මානසික හෝ භෞතික විනාශයක් වීම ආපදාවයි. ශීතෝෂ්ණගුණයෙන් ඇති වන ස්වභාවය උතු නියාමය නම් වන බව සුමඞ්ගල ශබ්දකෝෂය පවසයි.[106] ඒ අනුව විවිධ කාලවල බලපවත්වන හේමන්ත, ගිම්හාන, වස්සාන ආදී ඍතුන්ගේ බලපෑමෙන් සිදුවන දේවල්වලට මුහුණපාන්නට මිනිසාට සිදුවේ. ධම්මසඞ්ණිප්පකරණ අටුවාවේ මෙය විග්‍රහ කරන්නේ, ඒ ඒ කාලවල ඒ ඒ ගස්වල එකක් නැර මල් ඵල හටගැනීම උතු නියාමය බවයි.[107] එසේ ඍතු බලපෑමෙන් ඇතිවන තත්ත්වයන් මිනිසාට හිතකර හෝ අහිතකර විය හැකිය. අහිතකර ලෙස බලපවත්වන තත්ත්වයන් සියල්ල ආපදවන් ය.

මිලින්ද ප්‍රශ්නයේ බඩගින්න, පිපාසය, සර්ප විස, ගින්න, ජලය, වා, පිත්, සෙම් හෝ ඒවායෙහි එකතුවෙන්, ඍතු බලපෑමෙන් හෝ උපක්‍රමයන්ගෙන් අකාලයේ මිය යන්නට හැකි බව පවසයි.[108] මෙලෙස මරණයට පත්වීම කර්ම විපාක වශයෙන් මියයෑමක් නොව සාමයික (ලෞකික) වශයෙන් උපන් කාරණාවන් නිසා සිදු වන්නකි.

ඍතු වෙනස් වීමෙන් ගින්න, ජලය හා සුළඟ කේන්ද්‍ර කරගත් අසමතුලිතතාවන් ඇතිවේ. එනිසා ම සත්ත්වයින්ට කායික වශයෙන් මෙන් ම බාහිර පරිසරයෙන් ද ස්වාභාවිකව විවිධ ආපදාවන් ඇතිවේ. අංගුත්තර නිකායේ ගින්නෙන්, ජලයෙන් ආපදාවන් විය හැකි බව දේශනා කර තිබේ.[109] ඒවායෙහි බලපෑමකින් මානව හෝ භෞතික සම්පත් විනාශවීම නිසා පුද්ගලයාට කායික හෝ මානසික වශයෙන්



02 OCT 2015

යම් වේදනාවක් හෝ අහිමිවීමක් වේ නම් එය ආපදාවකි. ජාතිං හෝ භොගානං පහඩ්ගරං [110] යනුවෙන් අව්වෙන් වැස්සෙන් පෙළෙමින් වෙළඳාමෙන් සීසෑමෙන් දුකසේ උපයාගත් පරිභෝජන ද්‍රව්‍යයන් හා ධන සම්පත් විනාශවීමෙන් පිරිහීම දසවිපත්වල වේ. කාම ජාතකයේ[111] මහා වර්ෂාවෙන් අචිරවතී ගඟ පිරී ඉතිරී ගොස් එක්තරා බමුණෙකුගේ භෝග විනාශය වූවාක් මෙනි. සමුද්ද වාණිජ ජාතකයේ[112] මහ මුහුද ගොඩගැලීමෙන් දිවයිනක් ම විනාශ වූ අයුරු විස්තර කරයි. එමෙන් ම මිනිසුන් බියෙන් කල්ගෙවන කාරණා තුනක් ගැන අංගුත්තර නිකායේ සඳහන්වේ. එනම්, ගිනි, ජල හා සොර බිය යි.

> 'යම් කලෙක්හි මහාමේඝයෙක් නැගේ ද එබඳු වූ කාලයෙක් වේ. මහණෙනි, මහත් මේඝය නැගිකල්හි මහ ගංවතුරක් නැඟෙයි. මහණෙනි, මහගංවතුරු නැගිකල්හි එයින් ගම්හු ද හයනු ලැබෙත්. නියම්ගම්හු ද හයනු ලැබෙත්. නගරයෝ ද හයනු ලැබෙත්. ගමුහු හයනු ලබන කල්හි නියම්ගමුදු හයනු ලබන කල්හි නුවරුදු හයනු ලබන කල්හි....'[113]

ගිනිවිපත් හේතුවෙන් පෙළෙන මිනිසා කායිකවත් මානසිකවත් අනේකවිධ වූ පීඩාවන්ට ගොදුරු වන්නේය. ඒ පිළිබඳව විස්තර කරන අංගුත්තර නිකාය,

> 'යම් කලෙක මහා අග්නි දාහයෙක් නගී ද එබඳු කාලයෙක් වේ ම ය. මහණෙනි, මහත් අග්නි දාහයක් නැගී සිටි කල්හි එයින් ගම්හු ද දැවෙත්. ගමුදු දැවෙන කල්හි නියම් ගමුදු දැවෙන කල්හි නුවර ද දැවෙන කල්හි...'[114]

ගින්නක් උපන් කල්හි මිනිසුන් විසින් මහන්සියෙන් උපයාගත් දෑ විනාශවීම මෙන් ම ශාරීරික හානියක් වේ නම් එය මහත් ආපදාවකි. ස්වාභාවික ගින්නෙන් ගේ, දොර ආදී දෑ විනාශවීම (අගාරානි අග්ගිං ඩහති) [115] දසවිපත්වලට අයත් ස්වාභාවික ආපදාවකි. ගිනි විපත්වල ආදීනව පහක් දැක්වේ.

ඇසට අහිත වීම
දුර්වර්ණ කිරීම
දුර්වල කිරීම
ගණසංගනිකා වීම



තිරශ්චීන කතා පිණිස පැවතීම[116] ආදිය යි. ඒවා ස්වාභාවික රෝග වශයෙන් සැලකේ.

නිධිඛණ්ඩ සූත්‍රයෙහි දුර්භික්ෂ හේතුවෙන් ද ආපදා ඇතිවන බව පවසයි.[117] එය ඍතු නියාමයෙන් ඇතිවන්නකි. එවිට හාත්පස පාරිසරික විපර්යාසයත් වායු දූෂණයත් වේ. මධුරා නගරයෙහි හටගත් එවන් පාරිසරික විපර්යාසයෙහි ආදීනව පහක් අංගුත්තර නිකායේ දැක්වේ.

1. විසමා - (විෂම ය.)
2. බහුරජා - (බොහෝ දූලි ඇත.)
3. චණ්ඩ සුනඛා - (සැඩ බල්ලන් ඇත.)
4. වාළයක්ඛා - (නපුරු යක්ෂයන් ඇත.)
5. දුල්ලභ පිණ්ඩා - (පිණ්ඩපාතය දුර්ලභය.)[118]

මේ අයුරින් ඍතුමය වශයෙන් වන බලපෑමෙන් පාරිසරික ව්‍යසනයන් ඇතිවේ. ඍතු විපර්යාසය නිසා හටගන්නා ව්‍යසන හෝ ආපදාවන් දුරාතීතයේ පටන් ම මිනිසා බාහිර අධිකාරයක බලයක් සේ සිතන්නට පුරුදු වී තිබේ. එහෙත් බුදු දහම අවධාරණය කරන්නේ එවන් බලපෑමක් නොව ඍතුමය නියමයන් ස්වභාවිකව ම ලෝකයේ ක්‍රියාත්මක වන බවයි. එහෙත් එම නියාමයන් ද ස්ථිර ඒවා නොවේ. මානව චර්යාවන්ගේ ප්‍රතිඵල හෝ ඒවා තුළින් ම ඇති වන භූතල වෙනස් වීමාදී විපර්යාසයන් නිසා ස්වභාවික නියමයන් ද වෙනස් වේ. ඒ අනුව ඇති වන සංසිද්ධීන්හි දී එනිසා ම අත්වන ඉරණම මත විපත් හඳුනා ගනී.

## සමාලෝචනය

මානව වංශකතාවේ දී මිනිසා අනේක ආපදාවන්ගෙන් හෙවත් දුක්ඛයන්ගෙන් විඳවයි. එහෙයින් නිරන්තරයෙන් උත්සහ කරන්නේ තමන් කෙරෙහි බලපවත්වන ආපදාවෙන් මිඳීමේ පිළිවෙත හඳුනා ගැනීමට යි. භෞතික නිමැවුම්, ආගම හෝ දර්ශනය යන සියල්ල ඊට අයත්වේ. බුදුදහම ද එහි ම ප්‍රතිඵලයකි. බුදුදහම ඒකදේව වාදය, ආත්මවාදය, අකිරියවාදය, නියතිවාදය හා පුබ්බේකතහේතුවාදය ප්‍රතික්ෂේප කරයි. කිරියවාදය, අදේවවාදය හා අනාත්මවාදය ප්‍රකට කරන්නේ හේතුඵලවාදී නියමයෙනි. එහෙත් බුදුදහම ඒකහේතුවාදයක් නොවේ.

පංච නියාම ධර්මයන් පිළිබඳ වූ අටුවා විවරණය මුල් දේශනානුසාරයෙන් ධර්මය පිළිබඳ තවත් විවරණයකි. ඒ අනුව පුද්ගලයා හා බැඳුන සාංසාරික දුක විවිධ හේතුකාරණාවන් මත පදනම් වන බව පැහැදිලිය. එහෙයින් ම බුදුදහම ගුඪ දර්ශනයක් නොවන්නේය. සංකීර්ණ ස්වභාවය වටහාගත යුත්තේ ධර්මානුකූලවයි. එවිට මිථ්‍යාදෘෂ්ටි ඉවත් වන අතරම සම්‍යග් දෘෂ්ටිය ප්‍රකට වන්නේය. පංචනියාම ධර්ම පිළිබඳ වූ විවරණය ආපදාවේ හෙවත් දුකෙහි සමුදය හෙවත් හට ගැනිමේ මූල හේතු විවරණය කරයි.

---

1 **බෞද්ධ ශබ්ද කෝෂය I**, 834 පිටුව.

2 - එම -.

3 කන්දරපංගුවේ ධම්මරංසි හිමි, **සංඛ්‍යා ධර්මපද වර්ණනා**, 261 පිටුව.

4 දීඝ නිකාය II, **මහාපදාන සූත්ත,** 16 පිටුව, බු. ජ. මු.

5 අයමෙත්ථ ධම්මතා'ති: ... අයං සභාවො අයං නියමොති වුත්තං හොති. නියාමො ච නාමෙස කම්මනියාමො උතුනියාමො බීජනියාමො චිත්තනියාමො ධම්මනියාමොති පඤ්චවිධො.
**සුමඞ්ගලවිලාසිනි අට්ඨකථා,** හේවා. (සංස්), 288 පිටුව.

6 ඉමස්මිං පන ඨානෙ පඤ්චවිධං නියාමං නාම ගන්හිංසු. බීජ නියාමං උතු නියාමං...
**ධම්මසඞ්ඝනිප්පකරණ අට්ඨකථා,** හේවා. (සංස්), 240 පිටුව.

7 **සිංහල මිළිඳු ප්‍රශ්නය,** 181-182 පිටු.

8 මනො පුබ්බඞ්ගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා.....
බු. නි., (2) ධම්මපදය, **යමක වග්ගය**, 1-2 ගාථා, බු. ජ. මු.

9 චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි.....
අං. නි. III, **නිබ්බේධික සූත්ත**, 208 පිටුව, බු. ජ. මු.

10 චිත්තෙන ඛො භික්ඛු ලොකො නීයතී, චිත්තෙන පරිකස්සති, චිත්තස්ස උප්පන්නස්ස වසං ගච්ඡති.
අං. නි. II, **බහුස්සුත සූත්ත**, 344 පිටුව, බු. ජ. මු.

11 චිත්තේන නීයතී ලොකො චිත්තේන පරිකස්සති
චිත්තස්ස එක ධම්මස්ස සබ්බෙව වසමන්වගුති
සං. නි. 1, **චිත්ත සූත්ත**, 72 පිටුව. බු. ජ. මු.

12 තණ්හාය නීයතී ලොකො තණ්හාය පරිකස්සති......
තණ්හාය එකධම්මස්ස සබ්බේව වසමන්වගු
සං. නි. 1, **තණ්හා සූත්ත**, 72 පිටුව, බු. ජ. මු.

13 ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො.....
ම. නි. II, **රට්ඨපාල සූත්ත**, 440 පිටුව, බු. ජ. මු.

14 **ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය**, 364 පිටුව.

15 **සිංහල ශබ්දකෝෂය**, 542 - vi.



---

16 පුරිමා පුරිමා චිත්තචෙතසිකා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං චිත්ත චෙතසිකානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො'ති එවං යදෙතං චක්ඛුවිඤ්ඤාණාදීනං අනන්තරා සම්පටිච්ඡනාදීනං නිබ්බත්තනං, අයං චිත්තනියාමො.'
සුමඞ්ගලවිලාසිනි (1), හේවා. (සංස්), 289 පිටුව.

17 තීනි අකුසල මූලානි, ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසල මූලං...
දී. නි. III, **සඞ්ගීති සූත්‍රය**, 362 පිටුව, බු. ජ. මු.

18 චන්දවිමල නාහිමි, රේරුකානේ, පට්ඨාන ප්‍රකරණ මහා සන්නය, 20 පිටුව.

19 සො ආරම්මණෙ අභිසඞ්ග ලක්ඛණො මක්කටාලෙපො විය
අභිධම්මත්ථසංගහ, 276 පිටුව.

20 අසමුපන්නෙසු ආරම්මණෙසු ඉච්ඡාය පන්නෙසු ලොභෙන සමන්නාගතො.
ධම්මපදට්ඨකථා II, **හත්ථකස්ස වත්ථු**, හේවා. (සංස්), 534 පිටුව.

21 න කහාපන වස්සේන තිත්ථිකාමෙසු විජ්ජති....
බු. නි. (2), ධම්මපදය, (24) **බුද්ධවග්ගය**, 186 ගාථාව, බු. ජ. මු.

22 යදපි භික්ඛවෙ ලොභො, තදපි අකුසලං. යදපි ලුද්ධො අභිසඞ්ඛරොති. කායෙන වාචා මනසා තදපි අකුසලං.... ඉතිස්සමෙ ලොභජා ලොභනිදානා ලොභසමුදයා ලොභ පච්චයා අනෙක පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.
අං. නි. 1, තික නිපාත, 358 පිටුව, බු. ජ. මු.

23 පුන ච පරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. ....... අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං....
ම. නි. 1, **මහා දුක්ඛක්ඛන්ධ සූත්ත,** 205 පිටුව, බු. ජ. මු.

24 මමායිතෙ පස්සථ ඵන්දමානෙ - මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ....
බු. නි. සුත්තනිපාතය, **ගුහට්ඨක සූත්ත**, 241 පිටුව, බු. ජ. මු.

25 අබලානං බලීයන්ති - මද්දන්තෙනං පරිස්සයා,
තතොනං දුක්ඛමන්වෙති - නාවං භින්නමිවොදකං
බු. නි. සුත්තනිපාතය, **කාම සූත්ත**, 242 පිටුව, බු. ජ. මු.

26 **බෞද්ධ ශබ්ද කෝෂය**, 755 පිටුව.

27 සො දූස්සන්ති තෙන, සයං වා දූස්සති, දූස්සනමත්තමෙවචාති, දොසො
ඉතිවුත්තක අට්ඨකථා, හේවා. (සංස්), 36 පිටුව.

28 දොසෙන අභිභූතො පරියාදින්න චිත්තො අත්තබ්‍යාධායපි චෙතෙති, පරබ්‍යාධායපි චෙතෙති, උභයබ්‍යාධායපි චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිවෙදෙති...... අත්ථම්පි යථාභූතං න ජානාති, පරත්ථම්පි යථාභූතං න ජානාති, උභයත්ථම්පි යථාභූතං න ජානාති.
අං. නි. I, තික නිපාතය, 284 පිටුව, බු. ජ. මු.

29 දොසො මහාසාවජ්ජො ඛිප්පවිරාගී.......
අං. නි. 1, තික නිපාත, 356 පිටුව, බු. ජ. මු.

30 කොධනො උපනාහී ච - පාපමක්ඛී ච යො නරො,
විපන්නදිට්ඨී මායාවී - තං ජඤ්ඤා වසලො ඉති
බු. නි. සුත්තනිපාතය, **වසල සූත්ත**, 38 පිටුව, බු. ජ. මු.

31 **ධම්මපද විවරණය**, මොරගල්ලේ ශ්‍රී ඤාණොභාස තිස්ස (සංස්), 451 පිටුව.

32 **බෞද්ධ ශබ්ද කෝෂය**, 1254 පිටුව.

33 මුය්හන්ති තෙන, සයං වා මුය්හති, මුය්හනමත්තමෙවචාති, මොහො.



02 OCT 2015

ධම්මසඞ්ගනීඅටුවාව, **ධම්මුද්දෙසවරකථා**, හේවා. (සංස්), 126 පිටුව.

34 නවවිධෙන මානො, සෙය්‍යස්ස සෙය්‍යො හමස්මීති, සෙය්‍යස්ස සදිසො හමස්මීති, සෙය්‍යස්ස හීනො හමස්මීති......

මහානිද්දේසපාලි, **දුට්ඨට්ඨකසුත්ත, නිද්දේසපාළි**, 110 පිටුව, බු. ජ. මු.

35 චිත්තස්ස අන්ධභාව ලක්ඛණො මොහො, අඤ්ඤාණලක්ඛණො වා, අසම්පටිවෙධරසො, අසම්මාපටිපත්ති පච්චුපට්ඨානො, අන්දකාරපච්චුපට්ඨානො වා, අයොනිසො මනසිකාරපදට්ඨානො.

ධම්මසඞ්ගනීඅටුවාව, හේවා (සංස්), 125 පිටුව.

36 මොහො මහාසාවජ්ජො දන්ධවිරාගීති.

අං. නි. 1, තික නිපාතය, 356 පිටුව, බු. ජ. මු.

37 අං. නි. (1), තික නිපාතය, 480 පිටුව, බු. ජ. මු.

38 එවමෙව ඛො භික්ඛවෙ එවරූපො පුග්ගලො ලොභජෙහි පාපකෙහි අකුසාලහි ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දිට්ඨෙ චෙව ධම්මෙ දුක්ඛං විහරති. සවිඝාතං සඋපායාසං සපරිලාහං.

අං. නි. 1, තික නිපාතය, 236 පිටුව, බු. ජ. මු.

39 **බෞද්ධ ශබ්ද කෝෂය**, 14 පිටුව.

40 ...ඡන්දාගතිං ගච්ඡන්ති දොසාගතිං ගච්ඡන්ති භයාගතිං ගච්ඡන්ති මොහාගතිං ගච්ඡන්ති ඉමානි ඛො භික්කවෙ චත්තාරි අගතිගමනානී ති...'

අං. නි. II, **අගති සූත්‍රය**, 36 පිටුව, බු. ජ. මු.

41 කරෙතු කම්‍යතාජ්ඣාසයං කුසලං වා මා වා තං ඡන්දං, තෙන අකත්තබ්බභාවං පාපුනාතීති ඡන්දගතිං ගච්ඡති නාම...

කවීශ්වර හිමි, ඇම්. යූ., **සද්ධම්මචින්තාමණී**, 59 පිටුව.

42 පන්සියපනස් ජාතකපොත් වහන්සේ, (512) **ගණ්ඩතිණ්දු ජාතකය**, 1166-1177 පිටු.

43 හනන්ති භොගා දුම්මෙධං - නො ච පාරගවෙසිනො භොගතණ්හාය දුම්මේධො - හන්ති අඤ්ඤෙ ව අත්තනං

බු. නි. II, ධම්මපදය, **තණ්හා වග්ග** (24), 22 ගාථාව. බු. ජ. මු.

44 දුස්සතීති දොසො, දුස්සන ලක්ඛණො වා දුස්සනස්සභාවො දොසො. තෙන අකත්තබ්බභාවං පාපුණාතීති දොසාගතිං ගච්ඡති නාම.

කවීශ්වර හිමි, ඇම්. යූ., **සද්ධම්මචින්තාමණී**, 59 පිටුව.

45 අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ
යෙ තං උපනය්හන්ති - වෙරං තෙසං න සම්මති

බු. නි. (2) ධම්මපදය, **යමක වග්ගය**, 3 ගාථාව. බු. ජ. මු.

46 ...භීයතීති වා භායනට්ඨෙන භයං. තෙන අකත්තබ්බභාවං ගච්ඡතීති භයාගතිං ගච්ඡති නාම...

කවීශ්වර හිමි, ඇම්. යූ., **සද්ධම්මචින්තාමණී**, 59 පිටුව.

47 බහුං වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච
ආරාම-රුක්ඛ-චෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා
නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණමුත්තමං
නෙතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති

බු. නි. (2), ධම්මපදය 14, 188-189 ගාථා. බු. ජ. මු.

48 ...මුය්හතීති මොහො, මුය්හ ලක්ඛණො වා මුය්හනස්ස භාවො මොහො තෙන අකත්තබ්බභාවං ගච්ඡතීති මොහාගතිං ගච්ඡති නාම...

කවීශ්වර හිමි, ඇම්. යූ., **සද්ධම්මචින්තාමණී**, 59 පිටුව.



49 ම. නි. 1, **අනුමාන සූත්‍රය**, 228-233 පිටු, බු.ජ.මු.

50 ගල්මංගොඩ, සුමනපාල, **ආදි බෞද්ධ දර්ශනය**, 132 පිටුව.

51 අං. නි. III, **නිබ්බෙධික සුත්ත**, 208 පිටුව, බු. ජ. මු.

52 කරුණාරත්න, ඩබ්. එස්. **බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය**, 21 පිටුව.

53 - එම -.

54 චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා

අං. නි. III, **නිබ්බෙධික සුත්ත,** 208 පිටුව, බු. ජ. මු.

55 සමණො ඛලු භො ගොතමො කම්මවාදී කිරියවාදී

දී. නි. I, **සොණදණ්ඩ සුත්ත,** 230 පිටුව, බු. ජ. මු.

56 කම්මස්සකතා මානව සත්තා කම්ම දයාද කම්ම බන්ධු කම්ම යොනි කම්ම පටිසරණා යං කම්මං කරිස්සාමි.

ම. නි. III, **චූළකම්මවිභඞ්ග සුත්ත,** 432 පිටුව, බු. ජ. මු.

57 බු. නි. (2), ධම්මපදය, **යමක වග්ගය,** 1 ගාථාව.

58 - එම -, 2 ගාථාව.

59 ...කම්ම විපාකජානිපි ඛො සීවක ඉධෙකච්චානි වෙදයිතානි උප්පජ්ජන්ති,...

සං. නි. IV, **මොළියසීවක සූත්‍රය,** 436 පිටුව. බු.ජ.මු.

60 තත්‍ථ කුසලස්ස ඉට්ඨවිපාකදානං අකුසලස්ස අනිට්ඨ විපාකදානන්ති අයං කම්මනියාමො.....

සුමඞ්ගලවිලාසිනි (1), 288 පිටුව, බු. ජ. මු.

61 අං. නි. (6), දසක නිපාතය, 198 පිටුව, බු. ජ. මු.

62 මනෝරථපූරණී අට්ඨකථා (2), හේවා. (සංස්), 842 පිටුව.

63 ධම්මපදට්ඨකථා 1, හේවා. (සංස්), 2-13 පිටු.

64 - එම -, 13-19 පිටු.

65 තිස්සො ඉමා භික්ඛවෙ විපත්තියො. කතමා තිස්සො, කම්මන්ත විපත්ති, ආජීවවිපත්ති, දිට්ඨිවිපත්ති.

අං. නි. (1), තික නිපාතය, 486 පිටුව, බු. ජ. මු.

66 - එම -.

67 වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං.....

බු. නි. (2), ධම්මපදය (10), **දණ්ඩවග්ගය**, 138 ගාථාව.

68 දී. නි. III, **සඞ්ගීති සූත්‍රය**, 370 පිටුව, බු. ජ. මු.

69 පඤ්චිමා භික්ඛවෙ වණිජ්ජා උපාසකෙන අකරණියා, කතමා පඤ්ච, සත්‍ථ වණිජ්ජා මංස වණිජ්ජා මජ්ජ වණිජ්ජා විස වණිජ්ජා ඉමා ඛො භික්ඛවෙ පඤ්ච වණිජ්ජා උපාසකෙන අකරණියා.

අං. නි. III, **වණිජ්ජා සූත්‍රය**, 338 පිටුව. බු.ජ.මු.

70 දී. නි. 1, **බ්‍රහ්මජාල සූත්‍රය**, 2-81 පිටු, බු. ජ. මු.

71 අං. නි. 1, තික නිපාතය, 80, 82 පිටු. බු. ජ. මු.

72 දී. නි. III, **සඞ්ගීති සූත්‍රය,** 398 පිටුව, බු. ජ. මු.

73 සීලේන අනුපෙතස්ස සුතෙනත්‍ථො න විජ්ජති....

බු. නි. ජාතකපාළි 1, **සීලවීමංස ජාතකය**, 218 පිටුව, බු. ජ. මු.

74 සිල්වා, ලිලී ද, විජටයේ ජටං, ගැටළු නිරාකරණය, 8-9 පිටු.

75 කතමානි ඡ භොගානං අපායමුඛානි න සෙවති? සුරාමේරය
මජ්ජපමාදට්ඨානානුයොගො ඛො ගහපති පුත්තො....

දී. නි. III, **සිගාලක සූත්‍රය**, 293 පිටුව, බු. ජ. මු.

76 ඡ ඛො'මෙ ගහපතිපුත්ත ආදීනවා.... සන්දිට්ඨිකා ධනජානි, කලහප්පවඩ්ඪනී, රොගානං ආයතනං, අකිත්තිසඤ්ජනනි....

දී. නි. 3, **සිගාලක සූත්‍රය**, 293 පිටුව, බු. ජ. මු.

77 දී. නි. 3, **සිගාලක සූත්‍රය**, 293 පිටුව, බු. ජ. මු.

78 උපද්දවතීති, උපද්දවො අනත්ථං ජනෙන්තො අභිභවති අජ්ඣත්ත රතීති අත්ථො රාජදණ්ඩාදීනං අධිවචනං...

පදානට්ඨකතා, 149 පිටුව. සුත්තනිපාතට්ඨකතා, හේවා. (සංස්), 68 පිටුව.

79 යථාරූපානං ඛො පාපකානං කම්මානං හෙතු රාජානො චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා කම්මකාරණා කරොන්ති, තාළෙන්ති වෙත්තෙහිපි තාළෙන්ති... හත්ථම්පි ඡින්දන්ති. පාදම්පි ඡින්දන්ති. හත්ථපාදම්පි ඡින්දන්ති..... සුනඛෙහිපි ඛාදාපෙන්ති. ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති....

ම. නි. III, **බාලපණ්ඩිත සූත්ත,** 360 - 362 පිටු, බු. ජ. මු.

80 Karunatilake, H. N. S., This Confused Society, p.14.

81 දාළිද්දියං භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාමභොගිනොති..... වඩ්ඪීපි භික්ඛවෙ දුක්ඛා.... චොදනාපි... අනුචරියාපි... බන්ධනම්පි......

අං. නි. IV, **ඉණ සූත්‍රය**, 118 පිටුව. බු.ජ.මු.

82 පඤ්ඤාසීහ හිමි, මඩිහේ, සංවර්ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය, 17 පිටුව.

83 යො හවෙ ඉණමාදාය චුජ්ජමානො පලායති,
න හි තෙ ඉණමත්ථීති තං ජඤ්ඤා වසලො ඉති

බු. නි. සුත්තනිපාතය, **වසල සූත්ත**, 38 පිටුව. බු.ජ.මු.

84 Linton Rulph, **The Science of Man in the World Crises**, p230.

85 මලලසේකර, ගුණපාල සහ ජයතිලක, කේ. එන්. **බුද්ධාගම හා ජාතික ප්‍රශ්න**, 1960, 33 පිටුව.

86 ....යන්නූන මයං සාලිං විභජෙය්‍යාම, මරියාදං ඨපෙය්‍යාමාති.... මාස්සු භො සත්ත පුනපි එවරූපමකාසී'ති. අඤ්ඤෙද පාණිනා පහරිංසු.... මුසාවාදෝ පඤ්ඤායති දණ්ඩදානං පඤ්ඤායති.

දී. නි. III, **අග්ගඤ්ඤ සූත්ත**, 154-156 පිටු, බු. ජ. මු.

87 - එම -. 156-160 පිටු.

88 - එම -.

89 යස්මිං භික්ඛවේ රාජානො අධම්මිකා හොන්ති, රාජයුත්තාපි තස්මිං සමයේ අධම්මිකා හොන්ති. රාජයුත්තෙසු අධම්මිකෙසු බ්‍රාහ්මණ ගහපතිකාපි තස්මිං සමයෙ අධම්මිකා හොන්ති. .....විසමං චන්දිමසූරියා පරිවත්තන්ති. ......අප්පායුකා ච හොන්ති. දුබ්බණ්ණා ච දුබ්බලා ච බව්හාබාධා ච.

අං. නි. IV, **අධම්මික සූත්ත**, 140 පිටුව. බු. ජ. මු.

90 කදාචි රාජාදිවසෙන ආපදාපි උප්පජ්ජන්ති. තාසං එවං උප්පන්නාසු ආපදාසු භවිස්සතීති.

දීඝ නිකායට්ඨකතා සුමංගල විලාසිනි, II, **සිගාල සූත්ත වණ්ණනා,** 693-694 පිටු, බු. ජ. මු.

91 රාජතො වා චොරතො වා අප්පියතො වා දායාදතො තථාරූපාසු ආපදාසු පරියොදාය වත්තති,.....'



අංගුත්තර නිකාය II, චතුක්ක නිපාතය, 128 පිටුව. බු.ජ.මු.

92 සං.නි. IV, **කුල සූත්‍රය**, 586 පිටුව, බු.ජ.මු.

93 අඤ්ඤදත්ථු හරො මිත්තො - යො ච මිත්තො වචී පරො
උනුප්පියඤ් ච යො ආහ - අපායෙසු ච යො සඛා

දී. නි. III, **සිගාලක සූත්ත,** 300 පිටු, බු. ජ. මු.

94 බු. නි. සුත්තනිපාතය, **පරාභව සූත්‍රය**, 32 පිටුව, බු. ජ. මු.

95 සද්ධර්මාලඞ්කාරය, **වානර වස්තුව**, 749-752 පිටු.

96 සද්ධර්මාලඞ්කාරය, **දුබ්බිට්ඨිමහාතිස්ස** වස්තුව, 793-796 පිටු.

97 බු. නි. 2, ධම්මපදය, **දණ්ඩ වග්ගය**, 11 ගාථාව.

98 - එම -.

99 පඤ්චිමානි භික්ඛවෙ ඨානානි අභිණ්හං පච්චවෙක්ඛිතබ්බානි ඉත්ථියා වා පුරිසේන වා..... ජරාධම්මොම්හි ජරං අනතීතො'ති.... ව්‍යාධිධම්මොම්හි.... මරණධම්මොම්හි.... සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො.....

අං. නි. III, **ඨාන සූත්‍රය**, 112-114 පිටු, බු. ජ. මු.

100 පස්ස චිත්තකතං බිම්බං ආරුකායං සමුස්සිතං
ආතුරං බහු සංකප්පං යස්ස නත්ථි ධුවං ඨිති

බු.නි. (2) ධම්මපදය, **ජරා වග්ගය**, 147 ගාථාව.

101 පරිජිණ්ණමිදං රූපං රොගනිඩ්ඩං පභංගුරං
භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතං

බු.නි. (2) ධම්මපදය, **ජරා වග්ගය**, 148 ගාථාව.

102 අං. නි. III, **ඨාන සූත්‍රය**, 112-114 පිටු, බු. ජ. මු.

103 ජිඝච්ඡා පරමා රොගා - සඞ්ඛාරා පරමා දුඛා
එතං ඤත්වා යථාභූතං - නිබ්බාණං පරමං සුඛං

බු. නි. (2), ධම්මපදය, **සුඛ වග්ගය**, 203 ගාථාව.

104 පිත්ත සමුට්ඨානා ආබාධා සෙම්හ සමුට්ඨානා ආබාධා වාත සමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා.....

අං. නි. 6, **ගිරිමානන්ද සූත්‍රය**, 198 පිටුව, බු. ජ. මු.

105 අඞ්ගුත්තරනිකායට්ඨකථා, 842 පිටුව, බු. ජ. මු.

106 ශ්‍රී සුමඞ්ගල ශබ්ද කෝෂය, 176 පිටුව.

107 තස්මිං තස්මිං සමයෙ තෙසං තෙසං රුක්ඛානං එකප්පහරෙනෙව පුප්ප ඵල පල්ලවග්ගහණං උතුනියාමො නාම...

ධම්මසඞ්ගනිප්පකරණ අට්ඨකථා, හේවා. (සංස්), 241 පිටුව.

108 ජිඝච්ඡාය පිපාසාය - අහිදට්ඨා විසේන ච
අග්ගි උදක සත්තෙහි - අකාලෙ තත්ථ මීයති
වාතෙන පිත්තෙන සෙම්හේන - සන්නිපාතෙ උතුනි ච
විසමොපක්කම කම්මෙහි - අකාලෙ තත්ථ මීයති

**සිංහල මිලින්ද ප්‍රශ්නය**, ගලගම ශරණංකර (සංස්), 180-185 පිටු.

109 ....යා තා හොන්ති ආපදා අග්ගිතො වා උදකතො වා.... ආපදාසු පරියොදාය වත්තති,.....

අංගුත්තර නිකාය II, චතුක්ක නිපාතය, 128 පිටුව. බුඃ ජඃ මුඃ

110 බු. නි. (2), ධම්මපදය **දණ්ඩ වග්ගය**, 138-139 ගාථා, බු. ජ. මු.

111 ජාතක පොත් වහන්සේ II, **කාම ජාතකය** (460), 938 පිටුව.

112 ජාතක පොත් වහන්සේ II, **සමුද්දවාණිජ ජාතකය** (495), 935-937 පිටු.

113 සො සමයො යං මහාමේඝො උට්ඨාති, මහාමේඝෙ බො පන භික්ඛවෙ උට්ඨිතෙ මහාඋදකවාහකො සඤ්ජායති, මහාඋදකවාහකෙ බො පන භික්ඛවෙ සඤ්ජාතෙ තෙන ගාමාපි වුය්හන්ති. නිගමාපි වුය්හන්ති.....

අං. නි. 1, තිකනිපාතය, 318 පිටුව, බු. ජ. මු

114 යං මහාඅග්ගිඩාහෙ බො පන භික්ඛවෙ උට්ඨිතෙ තෙන ගාමාපි ඩය්හන්ති, නිගමාපි ඩය්හන්ති, නගරාපි ඩය්හන්ති. ගාමෙසුපි ඩය්හමානෙසු නිගමෙසුපි ඩය්හමානෙසු නගරෙසුපි ඩය්හමානෙසු.....

අං. නි. 1, තික නිපාතය, 318 පිටුව.

115 බු. නි. (2), ධම්මපදය **දණ්ඩ වග්ගය,** 138-139 ගාථා.

116 පඤ්චිමෙ භික්ඛවෙ ආදිනවා අග්ගිස්මිං. කතමෙ පඤ්ච, අචක්ඛුස්සො, දුබ්බණ්ණකරණො, සඞ්ගණිකාපවද්ධනො, තිරච්ඡානකථා පවත්තනිකො....

අං. නි. III, 414 පිටුව, බු. ජ. මු.

117 දුබ්භික්ඛෙ ආපදාසු වා - එතදත්ථාය ලොකස්මිං...

ඛුද්දක නිකාය I, ඛුද්දකපාඨ, **නිධිකණ්ඩ සූත්‍රය**, 17 පිටුව, බු. ජ. මු.

118 අං. නි. 3, 414 පිටුව, බු. ජ. මු.